Lanka Phosphate Limited

# සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

## වාර්ෂික වාර්තාව *2019/20*

**කර්මාන්ත අමාත්‍යාංශය**

## දැක්ම

"එප්පාවල පොස්පේට් නිධිය ප්‍රශස්ත ලෙස භාවිතා කර ගනිමින් පෝෂ්‍යදායී පොස්පරස් මගින් අපගේ මාතෘභූමිය සාරවත් පසකින් සාරවත් කිරීම"






## මෙහෙවර

"පරිසර හිතකාමී සහ නව ක්‍රමවේදයන් හරහා පොස්පරස් වලින් ස්වයංපෝෂිත වෙමින් ජාතික පොස්පේට් අවශ්‍යතාවය සැපිරීම"

# පටුන


- අධ්‍යක්‍ෂ මණ්ඩලය 01
- හැඳින්වීම 02
- මූල්‍ය ඉස්මතු කිරීම් 03
- සභාපතිතුමාගේ ප්‍රකාශය 04-05
- ආයතනික ව්‍යුහය 06
- අනුමත කාර්ය මණ්ඩලය 07
- කළමනාකරණ කණ්ඩායම 08-09
- අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 10-12
- විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව 13
- විගණකවරුන්ගේ වාර්තාව 14-16
- විගණනය කළ මූල්‍ය ප්‍රකාශන
  - කාල පරිච්ඡේදය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 17
  - 2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 18
  - කාල පරිච්ඡේදය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය 19
  - කාල පරිච්ඡේදය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 20
  - සංස්ථාපිත තොරතුරු, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තින් සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 21-39
- මෙහෙයුම් සමාලෝචනය 40-42
- රැස්වීම් වාරය දැනුම්දීම 43
- පෙරකලාසියේ ආකෘතිය 44

# අධ්‍යක්ෂ මණ්ඩලය




**අනිල් රණසිංහ මහතා**
සභාපති හා කළමනාකරණ අධ්‍යක්ෂ



**එන්.එම්.එස්.කරුණාදාස මහතා**
අධ්‍යක්ෂ



**ඒ.පී.මොරගොඩ මහතා**
අධ්‍යක්ෂ



**ඩී.ආර්.ටී.රුවන්පුර මහතා**
අධ්‍යක්ෂ



**එස්.අබේවර්ධන මහතා**
අධ්‍යක්ෂ



**ජේ.ඒ.ඩබ්.ජයසූරිය මහතා**
අධ්‍යක්ෂ

## *හැඳින්වීම*

**සමාගමේ නම**

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම

**පිහිටි ස්ථානය සහ නීතිමය ස්වරූපය**

සී'ස ලංකා පොස්පේට් ආයතනය 1992 ජූලි මස 10 වන දින සීමිත වගකීමක් සහිත සමාගමක් වශයෙන් 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපිත කරන ලද්දේ රාජ්‍ය කැනීම් හා ඛණිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය ලෙස 1987 අංක 23 දරණ පොදු සංස්ථා හෝ රජයට අයිතිය පවරා ගන්නා ව්‍යාපාර පොදු සමාගම් වශයෙන් පරිවර්තනය කිරීමේ පනත යටතේය. කෙසේ නමුත් 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ මෙකී සමාගම නැවත ලියාපදිංචි කරනු ලැබ ඇත.

**මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය**

බහු වාර්ෂික කෘෂි භෝග සඳහා පොහොර වශයෙන් යොදවන පාෂාණ පොස්පේට් කැනීම් සැකසුම සහ අලෙවි කිරීම සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

**ලියාපදිංචි අංකය**

පී.බී.308

**අධ්‍යක්ෂ මණ්ඩලය**

| | | |
|---|---|---|
| **ඉංජිනේරු අනිල් රණසිංහ මහතා** | - | **සභාපති** |
| **එන්.එම්.එස්.කරුණාදාස මහතා** | - | **අධ්‍යක්ෂ** |
| **ඒ.පී.මොරගොඩ මහතා** | - | **අධ්‍යක්ෂ** |
| **ඩී.ආර්.ටී.රුවන්පුර මහතා** | - | **අධ්‍යක්ෂ** |
| **එස්.අබේවර්ධන මහතා** | - | **අධ්‍යක්ෂ** |
| **ජේ.ඒ.ඩබ්.ජයසූරිය මහතා** | - | **අධ්‍යක්ෂ** |

**සමාගමේ ලේකම්**

සී/ස මූල්‍ය සේවා සහ වෙළඳ නියෝජිත පුද්ගලික සමාගම, 300/72, නාවල පාර, නාවල

**අවසාන මව් සමාගම**

ශ්‍රී ලංකාවේ රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්ට මෙම සමාගමේ නිකුත් කළ කොටස් සම්පූර්ණයෙන්ම අයිතිව ඇත.

**රේඛීය අමාත්‍යංශය**

කර්මාන්ත අමාත්‍යාංශය,
තැ.පෙ. 570, 73/1, ගාළු පාර,
කොළඹ 03

**ලියාපදිංචි කාර්යාලය**

අංක 73 1/1, නව කැළණි පාලම පාර,
කොළඹ 14.
දුරකථන අංකය - 94112459906/7
ෆැක්ස් අංකය - 94112459908

**විගණකවරු**

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය,
නො : 306/72, පොල්දුව පාර,
බත්තරමුල්ල.

**බදු උපදේශකවරු**

අමරසේකර සහ සමාගම
වරලත් ගණකාධිකාරවරු,
නො.12 - රොටුන්ඩා උද්‍යානය,
කොළඹ 03.

**බැංකුකරුවන්**

ලංකා බැංකුව
ජාතික ඉතිරිකිරීමේ බැංකුව
මහජන බැංකුව

## මූල්‍ය ඉස්මතු කිරීම්

**වර්ෂය සඳහා** (රුපියල් '000)

| | 2019/20 | 2018/19 | 2017/18 | 2016/17 | 2015/16 |
|---|---|---|---|---|---|
| ආදායම | 510,004 | 530,975 | 493,551 | 366,094 | 562,735 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය (අලාභය) | 9,786 | 33,960 | 3,220 | (10,534) | 26,587 |
| මුළු විස්තීර්ණ ආදායම (වියදම) | 23,118 | 109,726 | (4,475) | (14,577) | 29,578 |

**වර්ෂ අවසාන දිනට** (රුපියල් '000)

| | 2019/20 | 2018/19 | 2017/18 | 2016/17 | 2015/16 |
|---|---|---|---|---|---|
| කොටස්හිමියන්ගේ අරමුදල | 787,765 | 771,646 | 669,834 | 740,738 | 760,315 |
| කාරක ප්‍රාග්ධනය | 527,750 | 480,273 | 419,904 | 442,665 | 451,108 |
| මුළු වත්කම් | 905,035 | 892,603 | 757,572 | 836,113 | 860,451 |
| කාර්ය මණ්ඩල පිරිවැය | 303,310 | 292,861 | 230,782 | 224,678 | 236,020 |
| සේවක සංඛ්‍යාව **(ගණන)** | 333 | 328 | 333 | 335 | 347 |

**කොටසකට**

| | 2019/20 | 2018/19 | 2017/18 | 2016/17 | 2015/16 |
|---|---|---|---|---|---|
| ඉපැයීම් **(රුපියල්)** | 3.19 | 15.13 | (0.62) | (2.01) | 4.08 |
| ශුද්ධ වත්කම් **(රුපියල්)** | 108.64 | 106.42 | 92.38 | 102.16 | 104.86 |

**අනුපාතයන්**

| | 2019/20 | 2018/19 | 2017/18 | 2016/17 | 2015/16 |
|---|---|---|---|---|---|
| ජංගම අනුපාතය (වාර) | 14.54 | 12.75 | 11.09 | 7.90 | 7.41 |
| කොටස්හිමියන්ගේ අරමුදලට ප්‍රතිලාභ (%) | 2.93% | 14.22% | (0.67%) | (1.97%) | 3.89% |

## සභාපතිවරයාගේ පණිවිඩය



පොස්පේට් පාෂාණය කෘෂිකර්මාන්තයට හා අනිකුත් කර්මාන්තවලට උපයෝගී වන බොහෝ ප්‍රයෝජන ඇති වැදගත් වාණිජ මූලයකි. ශාක වැඩීමට හා ප්‍රවර්ධනය පොස්පේට් ඉතා අත්‍යවශ්‍ය පෝෂකයකි. පොස්පේට් පරිභෝජනය පොහොර කර්මාන්තයේ සිට විෂබීජනාශක ද්‍රව්‍ය නිෂ්පාදන (සෝදන ද්‍රව්‍ය) කර්මාන්තය, පිඟන් කර්මාන්තය හා වෙනත් කර්මාන්ත විශාල ගණනකට අදාළ වේ. ලෝක වෙළඳපොළ තුළ රොක් පොස්පේට් වඩාත් ස්වාභාවික හා තිරසාර බැවින් රසායනික පොස්පේට් පොහොර සඳහා කාබනික විකල්පයක් ලෙස පිළිගනු ලැබේ.

ලෝක පොස්පේට් සංචිත සීමාසහිත වන අතර නැවත ජනනය නොවේ. එමනිසා ඒවා උපරිම හා තිරසාර ක්‍රියාවලියක් තුළ ප්‍රයෝජනයට ගත යුතුයි. ලෝකයේ පොහොසත්ම සහ අසම සම එක්තරා පොස්පේට් නිධියක් ලෙස සළකන ශ්‍රී ලංකාවේ පොස්පේට් සංචිතය 33% 40% ක පමණ $P_2O_5$ ඛණිජ අඩංගුවේ. 1971 දී එප්පාවල පොස්පේට් නිධිය සොයාගත් අතර, එය මෙ.ටො. මිලියන 60ක පමණ පොස්පේට් සංචිතයකි. ශ්‍රී ලංකාවේ දේශීය පොස්පේට් පොහොර අවශ්‍යතාවය සැපිරීමට ලංකා පොස්පේට් සමාගම රොක් පොස්පේට් පොහොර නිපදවීම සිදුකරයි. වර්තමාන ධාරිතව අනුව ලංකා පොස්පේට් සමාගම දේශීය අවශ්‍යතාවය සඳහා එප්පාවල රොක් පොස්පේට් (ERP) මෙ.ටො 50,000ක් පමණ වාර්ෂිකව නිපදවන අතර, එය පුද්ගලික හා රාජ්‍ය පොහොර සමාගම් හරහා ගොවියන් වෙත බෙදාහරී.

වර්තමානයේ සමාගම විසින් එප්පාවල රොක්පොස්පේට් (ERP) සහ අධි - ශ්‍රේණියේ එප්පාවල රොක්පොස්පේට් (HERP) යනුවෙන් වර්ග දෙකක් නිපදවනු ලබන අතර මේවා ශ්‍රී ලංකාවේ බහු භෝග සඳහා පොහොර ලෙස භාවිතා කරනු ලැබේ. මීට අමතරව සමාගම විසින් පොල් පොහොර මිශ්‍රණාගාරයක් 2014 වර්ෂයේ සිට පවත්වාගෙන යයි.

රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර පොදු සමාගම් වලට පරිවර්තනය කිරීමේ 1987 අංක 23 දරණ පනතේ කොන්දේසි යටතේ පොස්පේට් සමාගම 1992 ජුලි මස 10 වන දින සංස්ථාපිත කරන ලද්දේ රාජ්‍ය කැනීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීමටය. මෙම සමාගමෙහි සම්පූර්ණ අයිතිය ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාර ලේකම්තුමා සතුවෙයි. 1998 නොවැම්බර් මස බෝගල ග්‍රැපයිට් ආයතනයේ වෙන්වීමත් සමඟ ලංකා පොස්පේට් සමාගම සම්පූර්ණයෙන්ම ස්වාධීන ආයතනයක් බවට පත්විය.

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සෞභාග්‍යයේ දැක්ම තුළින් ඉදිරි කෘෂිකාර්මික දියුණුව තුළින් සෞඛ්‍ය සම්පන්න හා ඵලදායී සමාජයක් බිහිකිරීම සඳහා ලංකා පොස්පේට් සමාගමට රටේ පොහොර නිෂ්පාදන කර්මාන්තය තුළින් භාරදූර කාර්යභාරයක් ඉටු කිරීමට තිබේ.

සමාගමේ ඉතිහාසය තුළ නවතම ජයග්‍රහණය ලෙස "එප්පාවල පොහොර" යන සන්නාමය යටතේ සෘජුවම ගොවීන්ට ERP පොහොර මිශ්‍රනය සාධාරණ මිලකට ලබාදීම දැක්විය හැකිය. සමාගම වර්තමානයේ තාක්ෂණික උන්නතිය හා නිෂ්පාදනය නැංවීම තුළින් කර්මාන්තයේ ප්‍රමුඛ භූමිකාවක් අත්පත්කර ගැනීම් ක්‍රියාවේ යෙදී සිටී.

2019/2020 න් අවසන් ගිණුම් වර්ෂයේදී දළ ආදායම රුපියල් මිලියන 510 ක් වූ අතර එය පසුගිය වසර හා සසඳන විට සතුටුදායක මට්ටමකි. තවද, ලංකා පොස්පේට් සමාගම විසින් ඉහත විකුණුම් මට්ටම් අත්පත් කරගනු ලැබුවේ එප්පාවල රොක් ෆොස්පේට් පොහොර (ERP) මෙට්‍රික්ටොන් 35,171.75 ක් ද, අධි ශ්‍රේණියේ එප්පාවල රොක් ෆොස්පේට් පොහොර (HERP) මෙට්‍රික්ටොන් 8,689.65 ක්ද පොල් පොහොර මෙට්‍රික්ටොන් 567.24ක්ද වශයෙනි.

එප්පාවල පොස්පේට් නිධියේ උපරිම ප්‍රයෝජනය ලබා ගැනීමට අදාළව පවත්නා හා නව ව්‍යාපාරික අවස්ථා දියුණු කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටී. රටේ සමස්ථ කෙටි කාලීන බෝගවලට අවශ්‍ය වඩාත් ගැලපෙන පොස්පේට් වර්ග නිපදවීම ජාතික අවශ්‍යතාවයක් සහ වැදගත්කමක් ලෙස අප හඳුනාගෙන තිබේ.

එමනිසා, සමාගමේ මීළඟ ක්ෂණික අවශ්‍යතාවය ලෙස දේශීය SSP නිෂ්පාදනය හඳුන්වාදීමේ මූලික පියවර දැනටමත් ආරම්භ කර ඇත.


වගකීමක් ඇති රජයේ ආයතනයක් ලෙස ලංකා පොස්පේට් සමාගම, වටිනාකම් එකතු කරන ලද නිෂ්පාදන, මානව හිතවාදී පරිසර හා කාර්යමණ්ඩල පුහුණුවීම් වැඩ සටහන් වලට ප්‍රමුඛත්වය දෙමින් සේවකයන්ගේ කුසලතාවයන් හා හැකියාවන් සෑම අංගයකින්ම වැඩි දියුණු කිරීමට අපි එකතු වී වැඩ කරන්නෙමු.

අවසාන වශයෙන්, මේ සම්බන්ධයෙන් අප වෙත මඟ පෙන්වීම, ධෛර්යය, සහයෝගය හා දේශපාලන නායකත්වය ලබාදෙන කර්මාන්ත අමාත්‍යාංශයට, මහා භාණ්ඩාගාරයට සහ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ ප්‍රණාමය පුදකරමි.

ලංකා පොස්පේට් සමාගමට එහි ඉදිරි කටයුතු සාර්ථක කර ගැනීමට හැකි වේවායි මම ප්‍රාර්ථනා කරමි.

**ඉංජිනේරු අනිල් රණසිංහ**
**සභාපති**
**ලංකා පොස්පේට් සමාගම**

## ලංකා පොස්පේට් සමාගමෙහි සංවිධාන ව්‍යුහය (24-04-2015)



# අනුමත කාර්ය මණ්ඩලය

| ශ්‍රේණිය | වැටුප් බාණ්ඩය | තනතුර | තනතුරු ගණන |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරු | HM - 2-1 | සාමාන්‍යාධිකාරී | 01 |
| | HM - 1-3 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නිෂ්පාදන | 01 |
| | | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- නිෂ්පාදන නොවන | 01 |
| | HM - 1-1 | මූල්‍ය කළමනාකරු | 01 |
| | | නිෂ්පාදන කළමනාකරු | 01 |
| | | මෙහෙයුම් කළමනාකරු | 01 |
| | | පරිපාලන හා මානව සම්පත් කළමනාකරු | 01 |
| කළමනාකරු | MM - 1-1 | ගණකාධිකාරී | 01 |
| | | යාන්ත්‍රික ඉන්ජිනේරු | 01 |
| | | නිෂ්පාදන ඉන්ජිනේරු | 01 |
| | | අභ්‍යන්තර විගණක | 01 |
| | | සහාය සැපයුම් කළමනාකරු | 01 |
| | | සහාය අලෙවි කළමනාකරු | 01 |
| | | ආරක්ෂක කළමනාකරු | 01 |
| කළමනාකරු | JM - 1 – 1 | සැපයුම් නිළධාරී | 01 |
| | | පරිපාලන නිළධාරී (පරිපාලන හා මානව සම්පත්) | 01 |
| | | කර්මාන්තශාලා නිළධාරී | 01 |
| | | ගබඩා නිළධාරී | 01 |
| කළමනාකාර සහායක | MA 2-1 | | 28 |
| | MA 1-1 | | 30 |
| ප්‍රාථමික ශ්‍රේණිය | PL - 3 | | 73 |
| | PL - 2 | | 80 |
| | PL - 1 | | 120 |
| **මුළු ගණන** | | | **349** |

# කළමනාකරු කණ්ඩායම



**එච්. ආර්. යු. ඩී. බණ්ඩාර**
සාමාන්‍යාධිකාරී



**ඩී. පී. යු. චාමර**
මුල්‍ය කළමනාකරු



**එස්.ඩී.රූපසිංහ**
මෙහෙයුම් කළමනාකරු



**කපිතාන් කේ.පී.ආර්.පී.කිරිඇල්ල**
ආරක්ෂක කළමනාකරු



**ඩී. ආර්.කේ. තිලකරත්න**
ගණකාධිකාරී



**ආර්. ඒ. ඒ. පී. රණසිංහ**
අලෙවි විධායක



**එච්.ඒ.ටී.ජයනන්ද**
යාන්ත්‍රික ඉන්ජිනේරු



**ඩී.බී.කීරියාවත්ත මහතා**
අභ්‍යන්තර විගණක



**එල්.එල්.ඩී.අයි.පැතුම්**
නිෂ්පාදන ඉංජිනේරු

# කළමනාකරු කණ්ඩායම



**එස්. ඒ. අබේසිරි**
සැපයුම් නිළධාරී



**එස්.එම්.ඒ.ආර්.කේ.මංචනායක**
නිළධාරී (පරිපාලන හා මානව සම්පත්)



**ඩී.ආර්.ගුණරත්න**
කර්මාන්තශාලා නිළධාරී



**ආර්.එම්.මද්දුමබණ්ඩාර**
සැපයුම් නිළධාරී



**ඩී.එස්.එම්.දිසානායක**
ගබඩා නිළධාරී

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

සී/ස ලංකා පොස්පේට් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2020 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඔවුන්ගේ විගණනය කරන ලද ගිණුම් සහ 2020 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරයි.

## 1.0 සමාගමේ නම

සී/ස ලංකා පොස්පේට් සමාගම (ලි.ප.අ. PB 308)

## 2.0 පිහිටි ස්ථානය හා නීතිමය ස්වරූපය

රාජ්‍ය පතල් හා ඛණිජ සංවර්ධන සංස්ථාවෙහි එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීම සඳහා 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර පොදු සමාගම් බවට පත්කිරීමේ පනතට අනුව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සීමාසහිත ලංකා පොස්පේට් සමාගම සීමාසහිත වගකීම් සහිත සමාගමක් වශයෙන් 1992 ජුලි 10 වන දින සංස්ථාගත කරන ලදී. කෙසේ නමුත් මෙම ආයතනය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරනු ලැබීය.

## 3.0 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ බහු වාර්ෂික භෝග සඳහා පොහොර වශයෙන් යොදා ගන්නා පොස්පේට් කැනීම් සිදුකිරීම, සකස් කිරීම හා අලෙවි කිරීම හා පොල් පොහොර මිශ්‍ර කිරීමයි.

## 4.0 මූල්‍ය ප්‍රකාශනය

මේ සමඟ අමුණා ඇති මූල්‍ය ප්‍රකාශනයෙන් වාර්තා කරන දිනට සමාගමේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පෙන්නුම් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය තෘප්තිමත්ව සිටී

මෙම මූල්‍ය ප්‍රකාශනය සැකසීමේදී සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කර ගනිමින් ඒවාට අනුරූපව සාධාරණව සහ ඒකාකාරිව නිගමන හා තක්සේරුකිරීම් සිදු කොට ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි. මෙම වාර්තාවේ අනාවරණය කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සැලකිය යුතු වෙනසක් සිදුවී නොමැති බව ඔවුන්ගේ අදහසයි. සමාගමේ අධ්‍යක්ෂකවරු විසින් වත්කම්වල සුරක්ෂිතභාවය රැක ගැනීමටත්, වංචා සහ අනෙකුත් අවිධිමත් කටයුතු වලක්වාගැනීමට සහ අනාවරණය කරගැනීමටත් පියවර ගෙන ඇත.

## 5.0 මූල්‍ය ප්‍රකාශන සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගණුදෙනු නිසි ලෙසට පෙන්නුම් කිරීමට සාධාරණව ඥාණාන්විතව සහ තක්සේරු කිරීම්වලට එළැඹීම සඳහා මනා ගිණුම්කරණ ප්‍රතිපත්තීන් භාවිතයට ගෙන ඇත. ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුළ ගිණුම්කරණ පිළිවෙත්වල කිසිදු වෙනසක් සිදු නොවීය.

## 6.0 දේපළ, පිරියත හා උපකරණ, ඒවායේ ගණනය කිරීම් සහ ක්ෂයවීම

සමාගම විසින් වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණ සඳහා දරා ඇති ප්‍රාග්ධන වියදම රු. 4,380,431.00 කි. දේපළ, පිරියත හා උපකරණවල ගණනය කිරීම හා ක්ෂය කිරීම්වල විස්තර සටහන් අංක 5.0 හා 26 හි පෙන්වා ඇත.

## 7.0 බදුකරණය

සමාලෝචනය කරන වර්ෂය තුල සමාගම බදු අයකළ හැකි ආදායමෙන් 28% ක බද්දකට යටත් වෙයි.

## 8.0 ලාභාංශ

සමාලෝචනය කරන වසර ඇතුළත ලාභාංශ ප්‍රකාශයට පත්කර නොමැත.

## 9.0 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමේ මුළු ප්‍රකාශිත ප්‍රාග්ධනය වූ රුපියල් 72,510,000/- සාමාන්‍ය කොටස් 7,251,000 කින් සමන්විත වේ. සමලෝචනයට භාජනය කරන වසර ඇතුලතද ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වෙනසක් නොවීය.

## 10.0 කොටස් හිමිකාරීත්වය

පොදු සංස්ථා හෝ රජයට අයිතිව ඇති පවරා ගන්නා ලද ව්‍යාපාර පොදු සමාගම් වශයෙන් පරිවර්තනය කිරීමේ 1987 අංක 23 දරණ පනතේ 2(3) වගන්තිය යටතේ සමාගමේ එකම කොටස්කරු වනුයේ රජය වෙනුවෙන් (රාජකාරි මට්ටමින්) භාණ්ඩාගාර ලේකම්ය.

2020 මාර්තු 31 දිනට සමාගමේ කොටස් හිමිකාරීත්වය පිළිබඳ විස්තර පහත සඳහන් වන පරිදිවේ.
භාණ්ඩාගාර ලේකම්ට (රාජකාරි මට්ටමින්) සාමාන්‍ය කොටස් 7,251,000 කි.

සී/ස GSMB ටෙක්නිකල් සර්විස් පුද්ගලික සමාගමේ කොටස්කරුවෙක් වන සී/ස ලංකා පොස්පේට් සමාගම සාමාන්‍ය කොටස් 100,000 ක හිමිකාරත්වය දරයි. (එකක් රු.10/- බැගින්)

මෙම හිමිකාරත්වය දැරීමේ ප්‍රතිශතය 16.66% කි.

## 11.0 කොටස් හිමිකාරත්වයේ වෙනස්වීම

සමාගමේ කොටස් හිමිකාරත්වයේ කිසිදු වෙනස්වීමක් 2020 මාර්තු 31 දින වන විට සිදුවී නැත.

## 12.0 සංස්ථාපිත සමාජ වගකීම

සමලෝචන වර්ෂය ඇතුලත සමාගම විසින් පුන්‍ය කටයුතු හා ආයතනික සමාජ වගකීම් සඳහා රුපියල් 120,497.06 ක් දරා ඇත.

## 13.0 සේවකයින්

වර්ෂය ඇතුලත සම්පූර්ණ සේවක මණ්ඩල පිරිවැය රුපියල් 303,310,428.00 කි.

වර්ෂය අවසානය වන විට සමාගම විසින් සේවයේ යොදවා ඇති සාමාන්‍ය සේවක සංඛ්‍යාව 324 ක් වේ.

## 14.0 අධ්‍යක්ෂකවරුන්

සමාලෝචිත වසර ඇතුලත පහත සඳහන් අය අධ්‍යක්ෂ තනතුරු දැරීය.

| | | |
|---|---|---|
| ඉංජිනේරු අනිල් රණසිංහ මහතා | - | සභාපති |
| එන්.එම්.එස්.කරුණාදාස මහතා | - | අධ්‍යක්ෂ |
| ජී.පී.මොරගොඩ මහතා | - | අධ්‍යක්ෂ |
| ඩී.ආර්.ටී.රුවන්පුර මහතා | - | අධ්‍යක්ෂ |
| ජේ.ඒ.ඩබ්.ජයසූරිය මහතා | - | අධ්‍යක්ෂ |
| සුදත් අබේවර්ධන මහතා | - | අධ්‍යක්ෂ |

## 15.0 අධ්‍යක්ෂකවරුන් පත්වීම හා ඉල්ලා අස්වීම

| | | |
|---|---|---|
| එච්.එම්.කරුණාරත්න හේරත් - | | සභාපති (15.01.2020) |
| ඩී.යූ.ජයවර්ධන (15.01.2020) - | | විධායක අධ්‍යක්ෂ |
| ඩී.එච්.එස්.පුල්ලෙපෙරුම (15.01.2020) | - | අධ්‍යක්ෂ |
| පී.එච්.හඳුන්හේවා (15.01.2020) | - | අධ්‍යක්ෂ |
| ජේ.එස්.පරණගම (15.01.2020) | - | අධ්‍යක්ෂ |
| ජේ.බී.යූ.එස්.ද සිල්වා (15.01.2020) | - | අධ්‍යක්ෂ |

වර්ෂය තුළ ඉල්ලා අස්වෙන ලදී.

ඉංජිනේරු අනිල් රණසිංහ මහතා - සභාපති (15.01.2020)

ඩී.ආර්.ටී.රුවන්පුර (15.01.2020)

ජේ.ඒ.ඩබ්. ජයසූරිය - අධ්‍යක්ෂ (15.01.2020)

එන්.එම්.එස්.කරුණාදාස - අධ්‍යක්ෂ (05.02.2020)

ජී.පී.මොරගොඩ - අධ්‍යක්ෂ (05.02.2020)

සුදත් අබේවර්ධන - අධ්‍යක්ෂ (05.02.2020)

2019/2020 වර්ෂය තුළ අළුතින් පත්කරන ලදී.

## 16.0 අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය

සමාලෝචිත වර්ෂය ඇතුලත රුපියල් 2,515,683.85 ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික ගාස්තු හා වියදම වශයෙන් ගෙවා ඇත.

## 17.0 ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ උපරිම දැනීමේ සහ විශ්වාසය අනුව රජයට, සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම නිවැරදිව සහ නියමිත දිනට කර ඇත.

## 18.0 අනුකූලවීම

මෙම සමාගම ශ්‍රී ලංකාවේ හෝ අන්තැනකට අදාල නීතිරීති සහ රෙගුලාසි උල්ලංඝනය කිරීමේ කටයුතුවල නියැලී නොමැත.

## 19.0 අඛණ්ඩ බව

සමාගමේ මෙහෙයුම් කටයුතු ඉදිරි අනාගත කාලයක් දක්වා පවත්වා ගෙන යෑමට ප්‍රමාණවත් සම්පත් ව්‍යාපාරය සතුව පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය තෘප්තිමත්ව සිටින අතර ඒ අනුව සමාගමේ සෑම මූල්‍ය ප්‍රකාශනයක්ම අඛණ්ඩ පැවැත්ම පදනම මත පිලයෙල කර ඇත.

## 20.0 සංස්ථාපිත පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය හොඳ සංස්ථාමය පාලනයක් සහතික කර ඇත. පොදු ව්‍යාපාරයක් වශයෙන් කොටස්රුවන්ගේ අපේක්ෂා සහ අරමුණු මෙන්ම සමාගමේ අරමුණු වලට සමාන්තරව එහි කාර්යසාධනය පවත්වාගෙන යෑම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි.

## 1.0 අවදානම් කළමනාකරණය

සමාගම විසින් නීතිමය අවදානම අඩු කිරිම හෝ සම්පූර්ණයෙන් ඉවත් කිරිම සහතික කිරිම සඳහා ව්‍යවස්ථාපිත සහ නීතිමය අවශ්‍යතාවයන් ඉටුකර ඇත.

## 22.0 විගණකයින්

සමාගමේ වර්තමාන විගණකවරු ලෙස රජයේ විගණකාධිපතිවරු කටයුතු කරයි.

2020 සැප්තැම්බර් මස 20 වන දින නො: 73 1/1, නව කැළණි පාලම පාර, කොළඹ 14 යන ලිපිනය දරන ලංකා පොස්පේට් සමාගමේ ප්‍රධාන කාර්යාලයේදී සවස 3.00 ට පැවැත්වූ වාර්ෂික මහා සභා රැස්වීමේ තීරණය අනුව, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ, 2020/2021 වර්ෂය සඳහා විගණකවරු නැවත පත්කිරීම කොටස්හිමියන්ට දැනුම්දීමට ලංකා පොස්පේට් සමාගමේ අධ්‍යක්ෂකවරු තීරණය කරන ලදී.

නව විගණකවරුන්ගේ පාරිශ්‍රමිකය සම්බන්ධව තීරණය කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලයට බලය පැවරිය යුතු බවට යෝජනා කරන යෝජනාවක්ද වාර්ෂික මහා සභා රැස්වීමේදී සලකා බැලීමට කටයුතු කොට ඇත.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා 2020 මාර්තු 31 දිනට සමාගම විසින් සපයන ලද මූලු විගණන ගාස්තුව රුපියල් 400,000 ක් විය. බදු උපදේශන සේවා සැපයීම වෙනුවෙන් අමරසේකර සහ සමාගමට වර්ෂය සඳහා රුපියල් 218,188/- ක මුදලක් ගෙවන ලදී.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අදහස පරිදි මෙම සමාගම හෝ එහි අනු සමාගම් සමඟ හෝ විගණකයින්ගේ ස්වාධීනත්වයට බලපෑමක් වන ආකාරයේ කිසිදු සම්බන්ධතාවයක් නොවීය.

**අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන්:**

සභාපති

FINANCIAL SERVICES AND COMMERCIAL AGENCIES (PRIVATE) LIMITED
COMPANY SECRETARIES TO LANKA PHOSPHATE LIMITED

සමාගම් ලේකම්වරු

# විගණක සහ කළමනාකරණ කමිටුවේ වාර්තාව

## සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම විගණන සහ කළමනාකරණ කමිටුව පත් කරන ලද අතර ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතුය. භාණ්ඩාගාරය වෙනුවෙන් පත් කර ඇති අධ්‍යක්ෂක මෙම කමිටුවේ සභාපති ධූරය දරයි. රේඛිය අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා හා තවත් විධායක නොවන අධ්‍යක්ෂවරයකු කමිටුවේ අතික් සාමාජිකයන් වන අතර විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිළධාරී වරයෙක් හා අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිරීක්ෂකයන් ලෙස කටයුතු කරයි.

## රැස්වීම්

කලින් ඉදිරිපත් වී තිබු ගැටළු සාකච්ඡා කිරිමට, කළමනාකරණ හා විගණන කමිටුව 2019/2020 වර්ෂය තුළ හතරවතාවක් රැස්විය. අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ලබා දීම සඳහා අභ්‍යන්තර විගණක විසින් භාරදෙන කාර්තුමය අභ්‍යන්තර විගණන වාර්තා හා පවත්නා පාලන විධි ඇගයීමට ලක් කරන ලදී.

## නිගමනය

වාර්තාව සියුම් ලෙස පරීක්ෂා කිරීමෙන් අනතුරුව සමාගමේ ගිණුම් ප්‍රතිපත්ති හා මෙහෙයුම් පාලන විධි හා අවධානම් කළමනාකරණ ක්‍රියාවලිය සඳහා බලපාන වැදගත් ගැටළු නිවැරදි කිරීමට කමිටුව විසින් උපදෙස් දෙන ලදී. තවද සමහර වැදගත් කරුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ සැලකිල්ලට හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කරන ලදී.

**සභාපති**
විගණන සහ කළමනාකරණ කමිටුව
**සී/ස ලංකා පොස්පේට් සමාගම**

මගේ අංකය - IMU/A/LPL/FA/01/2019 : 2020 සැප්තැම්බර් මස 24 දින

**සභාපති**

**ලංකා පොස්පේට් සමාගම**

2018 අංක 19 දරණ ජාතික විගණන පනතෙහි 12 වන වගන්තියට අනුව 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය ලංකා පොස්පේට් සමාගමේ මූල්‍ය ප්‍රකාශන හා අනිකුත් නීතිමය හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපති වාර්තාව

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සාරාංශය සහිත මූල්‍ය ප්‍රකාශනයට අදාළ සටහන් වලින් සමන්විත සීමාසහිත ලංකා පොස්පේට් සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ අංක 154 (1) ව්‍යවස්ථාවට ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 154 (6) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පාර්ලිමේන්තුවට මා ඉදිරිපත් කල යුතු වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ.

මගේ මතය වන්නේ, මෙම මූල්‍ය වාර්තා තුළින් සමාගමේ 2020 මාර්තු 31 දිනට සත්‍ය හා සාධාරණ ලෙස මූල්‍ය තත්ත්වය නිරූපණය කර ඇති බව සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ඉදිරිපත් කර ඇති බවයි.

### 1.2 විගණන මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. එම ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන විගණනයේදී, විගණකයාගේ වගකීම පිළිබඳව මගේ වාර්තාවෙහි අදාළ කොටසෙහි තවදුරටත් විස්තර කර ඇත. මා විසින් ලබාගන්නා ලද විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය වන අතර ඒවා ප්‍රකාශිත මතය සඳහා ප්‍රමාණවත් පදනමක් ලබාදෙන බව මාගේ විශ්වාසයයි.

### 1.3 කළමනාකරණයේ සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සැළකිය යුතු බලපෑමක් කළ හැකි පාර්ශවයන්ගේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශන සකස් කොට ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන අභ්‍යන්තර පාලන ක්‍රම තීරණය කිරීමද අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාගමට අඛණ්ඩව පැවතීමේ හැකියාව පිළිබඳව තක්සේරු කිරීමේ වගකීම කළමනාකරණය වෙත පැවරෙන අතර, සමාගම ඈවර කිරීම හෝ මෙහෙයුම් කටයුතු නැවැත්වීමේ අපේක්ෂාවක් හෝ එවැනි දු හැරෙන්නට වෙනත් විකල්පයක් නොමැති නම් හැර අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම ගිණුම්කරණයේදී භාවිතා කළ යුතුවේ.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම මූල්‍ය ප්‍රකාශන සඳහා බලපෑමක් කළ හැකි පාර්ශවයන්ගේ වගකීම වේ.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) වගන්තියට අනුව සමාගම විසින් එහි ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් වලට අදාළව නිසි පොත්පත් හා ගිණුම් වාර්තා සමාගමේ වාර්ෂික හා කාලච්ඡේදමය මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සඳහා හැකිවන පරිදි ඒවා පවත්වාගෙන යා යුතුවේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකවරුන්ගේ වගකීම

මගේ අරමුණ වන්නේ, සමස්ථයක් වශයෙන් ප්‍රමාණාත්මක අවනිදේශනයන්, වැරදි හා වංචා වලින් තොරව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්ද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මගේ මතය සහිතව විගණන වාර්තාවක් නිකුත් කිරීමයි. සාධාරණ තහවුරුවක් යනු, ඉහළ මට්ටමේ තහවුරු කිරීමක් වන නමුත් ශ්‍රී.ල.වි.ප්‍ර වලට අනුකූලව සිදුකරනු ලබන විගණනයේදී එලෙසෙ පවතින ප්‍රමාණාත්මක අවනිදේශනයන් සෑම විටම අනාවරණය කෙරෙන බවට ලබාදෙන සහතිකවීමක් නොවේ. අවනිදේශනයන්, වැරදි සහ වංචා වලින් පැන නැගිය හැකි වන අතර ඒවා ප්‍රමාණාත්මක සේ සළකන්නේ වෙන් වශයෙන් හෝ සමුච්චිත වශයෙන් ගත්විට මෙම මූල්‍ය ප්‍රකාශන පාදකව ඒවා පරිශීලනය කොට ගනු ලබන ආර්ථික තීරණ වලට බලපෑමක් සිදුවිය හැකි වන විටයි.

ශ්‍රී.ල.වි.ප්‍ර වලට අනුකූලව විගණනයේ කොටසක් ලෙස මා විසින් සමස්ථ විගණනය පුරා වෘත්තීය විනිශ්චයන් හා වෘත්තීමය සංශයවාදීත්වය (Skepticism) පවත්වා ගනු ලැබේ. තවද මම මේ සඳහා කරනු ලබන ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්වලට පහත දෑ අඩංගු වේ.

- වංචා සහ දෝෂයන් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක අවනිදේශනයන් පිළිබඳව අවධානම හඳුනාගැනීම හා තක්සේරුකරණය සහ එවැනි අවදානම් සඳහා ප්‍රතිචාර දක්විය හැකි විගණන පද්ධති ක්‍රියාත්මක කරනු ලබන අතර, අපගේ මතය සඳහා පසුබිමක් සපයන ප්‍රමාණාත්මක හා යෝග්‍ය විගණන සාක්ෂි රැස්කරගනු ලැබේ.
- විගණන ක්‍රියාපටිපාටි සකස් කිරීම පිණිස විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා නමුත් එමගින් සමාගම විසින් අනුගමනය කරනු ලබන අභ්‍යන්තර පාලනයෙහි ඵලදායීතාවය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම අරමුණුගත නොවේ.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය හා ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් සිදුකරන ලද ඒ හා සම්බන්ධිත අනාවරණයන් පිළිබඳව ඇගයීම.
- විගණනයේදී ලබාගන්නා ලද සාක්ෂි පාදකව කළමනාකරණය විසින් අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ගිණුම්කරණ පදනම භාවිතය පිළිබඳව යෝග්‍යතාවය තහවුරු කරගන්නා අතර, සමාගමට අඛණ්ඩ ඒකකයක් සේ පැවතීමේ හැකියාව පිළිබඳව අවිනිශ්චිතතාවයන් නිරූපණය කරන ප්‍රමාණාත්මක සිද්ධීන් සහ තත්ත්වයන් පවතින්නේද යන්න පිළිබඳව ඇගයීමක් කරනු ලැබේ. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් පවතින බව අප නිගමනයකට එළැඹෙන්නේ නම් අපගේ විගණන වාර්තාවේ ඒ පිළිබඳව අවධාරණය යොමු කිරීම අවශ්‍ය වන අතර එවැනි අවිනිශ්චිතතාවයන් පිළිබඳව ප්‍රමාණවත් අනාවරණයන් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොමැති නම් අපගේ විගණන මතය ඒ අනුව වෙනස්කිරීම කරනු ලැබේ. කෙසේවෙතත්, අනාගතයේ සිද්ධීන් හෝ තත්ත්වයන් සමාගම අඛණ්ඩ ඒකකයක් වශයෙන් පැවතීමේ හැකියාව නොමැතිවීමට බලපෑම් ඇති කළ හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය අනාවරණයන් සහිත සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳව ඇගයීමක් කරනු ලබන අතර එමගින් ආයතනයේ ගණුදෙනු සහ සිද්ධීන් මූල්‍ය ප්‍රකාශන තුළින් වඩාත් සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇත්ද යන්න පිළිබඳවද අගයීමක් කරනු ලැබේ.

සැලසුම් කරන ලද විෂය පථය සහ විගණනයේ කාල සීමාවන් සහ විගණනය තුළදී අප විසින් හඳුනාගන්නා ලද ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණයන් මෙන්ම අභ්‍යන්තර පාලනයෙහි ප්‍රමාණාත්මක ඌණතාවයන් පිළිබඳව අදාළ වගකිව යුතු පාර්ශවයන් වෙත සන්නිවේදනය කරනු ලැබේ.

## 2 අනෙකුත් නීති හා රෙගුලාසිවල අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරණ සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සඳහා විශේෂ ප්‍රතිපාදන ඇතුළත් කර ඇත.

- 2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 163 (2) (d) හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ අංක 12 (a) හි අවශ්‍යතාවයන්ට අනුකූලව නිසි පරිදි ගිණුම්කරණ වාර්තා ආයතනය විසින් පවත්වා ගත්තේද යන වග තීරණය කිරීමට හා විගණනය සඳහා අවශ්‍ය වන සියළුම දත්ත සහ විග්‍රහ කිරීම් මම ලබා ගතිමි.
- 2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 151 හි අවශ්‍යතාවයන්ට අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ අංක 6 (1) (d) (iii) ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පූර්ව වර්ෂයට ඒකාකාරී ලෙස ඉදිරිපත් කර ඇත.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ අංක 6 (1) (d) (iv) ට අනුකූලව පසුගිය වර්ෂයේදී මා විසින් ඉදිරිපත් කල සියලුම නිර්දේශයන් මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කර ඇත.

විගණනයේදී සිදුකරන ලද ක්‍රියාවලි සහ ලබාගත් සාක්ෂි පාදකව ප්‍රමාණාත්මක කරුණු සඳහා සීමා වන අතර, පහත දෑ පිළිබඳව කිසිදු කරුණක් මගේ අවධානයට යොමු නොවිණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 12 (d) වගන්තියට අනුකූලව, ආයතනයේ කිසියම් සේවකයෙකු සෘජුව හෝ වක්‍රව ආයතනය විසින් එළැඹී ඇති කොන්ත්‍රාත්වලට පෞද්ගලික සම්බන්ධයක් පවතීද යන්න සඳහන් කිරීම.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ අංක 12 (f) වගන්තියට අනුකූලව ආයතනයේ පාලක මණ්ඩලය විසින් විශේෂයෙන් නිකුත් කරන ලද මග පෙන්වීම් යටතේ ආයතනය විසින් අනුගමනය නොකරන යම් නීතීන් වේ නම් පහත සඳහන් ඒවා හැර ඒ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (g) දරන වගන්තියට අනුව සමාගම විසින් එහි බලතල, වගකීම් ක්‍රියාකාරකම් ඉටුකර නොමැති වග සඳහන් කිරීම.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (h) වගන්තියට අනුව සමාගම විසින් එහි සම්පත් නිසිපරිදි ඵලදායී හා කාර්‍යක්‍ෂම ලෙස ආර්ථික ප්‍රතිඵල ලැබෙන පරිදි භාවිතා කර ඇතිද යන්න පහත අවස්ථාවන්හීදී හැර සඳහන් කිරීම.

  (a) ආනයනය කරන ලද පොහොර පිරිවැය අඩුකිරීම සඳහා සහ වැඩිවන පොහොර ඉල්ලුමට මුහුණ දීමට 2016 අගෝස්තු මස නව ක්‍රෂර් යන්ත්‍රයක් රු. 34,654,178 ක පිරිවැයකට මිලදී ගන්නා ලදී. එහි සාමාන්‍ය නිෂ්පාදන ධාරිතාව පැයකට මෙ.ටොන් 40 කි. කෙසේවෙතත්, 2016 සිට එම යන්ත්‍රයේ ධාරිතාව සතුටුදායක ලෙස භාවිතා කර නොතිබූ අතර මෙ.ටොන් 15,337 ක පොහොර ප්‍රමාණයක් පමණක් වැඩකරන දින 103 කදී නිෂ්පාදනය කර තිබුණි.

  (b) 2014 දී කර්මාන්තශාලාව සඳහා නව යන්ත්‍රයක් ස්ථාපනය කිරීමට පිරිවැය රු. 7,440,000 ක් වූ අමතර කොටස් මිලට ගෙන ඇත. කෙසේ වුවත් එම යන්ත්‍ර අදාළ ස්ථානවල සවිකර නැත. රු. 11,513,434 ක් වටිනා අමතර කොටස් භාවිතයේ නොපැවතුණි. කෙසේවුවත්, ඒ සඳහා අදාළ නිලධාරීන් පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැත.

  (c) 2015 වසරේදී ආයතනය විසින් රු. 2,885,000 ක් වැය කර ආරක්‍ෂක කැමරා පද්ධතියක් සවිකර ඇති අතර, 2017 මාර්තු 31 වන විට අළුත්වැඩියා කටයුතු සඳහා රු. 1,165,900 ක මුදලක් වැය වී ඇත. කෙසේවුවත්, එම කැමරා 34 අතුරින් සක්‍රීය තත්ත්වයේ පවතින්නේ කැමරා 19 ක් පමණි.

**ඩබ්.පී.සී.වික්‍රමරත්න**
**විගණකාධිපති**

**සී/ස ලංකා පොස්පේට් සමාගම**

2020 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

*(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)*

| | සටහන | 2020 මාර්තු 31 | 2019 මාර්තු 31 (නැවත සකසන ලද) | වෙනස |
|---|---|---|---|---|
| ආදායම | **17** | 510,003,580 | 530,974,642 | (20,971,062) |
| විකුණුම් පිරිවැය | **18** | (321,281,896) | (341,893,724) | 20,611,828 |
| **දළ ලාභය** | | **188,721,684** | **189,080,918** | **(359,234)** |
| කර්මාන්තශාලා හා පරිපාලන වියදම් | **19** | (203,476,815) | (189,166,173) | (14,310,642) |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | **20** | (3,657,774) | (3,940,926) | 283,152 |
| මූල්‍ය පිරිවැය | **21** | (133,234) | (476,976) | 343,742 |
| **මෙහෙයුම් ලාභය** | | **(18,546,138)** | **(4,503,156)** | **(14,042,983)** |
| වෙනත් ආදායම් | **22** | 36,323,614 | 34,197,330 | 2,126,284 |
| **බදු වලට පෙර ලාභය** | | **17,777,475** | **29,694,174** | **(11,916,699)** |
| බදු වියදම | **23** | (7,991,253) | 3,691,204 | (11,682,457) |
| **වර්ෂය සඳහා ලාභය** | | **9,786,223** | **33,385,378** | **(23,599,156)** |
| **අනෙකුත් විස්තීර්ණ ආදායම්** | | | | |
| **වත්කම් ප්‍රත්‍යාගණනයෙන් ලද ලාභය** | | - | 109,916,265 | (109,916,265) |
| **වත්කම් ප්‍රත්‍යාගණනය මත විලම්භිත බදු වගකීම්** | | 16,313,125 | (30,776,554) | 47,089,679 |
| **විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණන අලාභ** | | (2,981,243) | (1,768,451) | (1,212,792) |
| **වර්ෂය සඳහා මුළු අනෙකුත් විස්තීර්ණ ආදායම්** | | 13,331,882 | 77,371,260 | (64,039,378) |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්** | | **23,118,105** | **109,725,714** | **(86,607,610)** |
| **කොටසක ඉපැයුම (රු.)** | 24 | **1.35** | **4.60** | **(3.25)** |

පිටු අංක 15 සිට 23 දක්වා ඇති පිටුවල ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 5 සිට 14 දක්වා පිටුවල ඇති මූල්‍ය ප්‍රකාශනවල සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

## සී/ස ලංකා පොස්පේට් සමාගම

2020 මාර්තු 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

*(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)*

| | සටහන | 2020 මාර්තු 31 | 2019 මාර්තු 31 | වෙනස |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 5 | 337,311,234 | 369,490,485 | (32,179,252) |
| කොටස්වල ආයෝජනය (GSMB Tech. Services (Pvt) Ltd) | 6 | 1,000,000 | 1,000,000 | - |
| | | **338,311,234** | **370,490,485** | **(32,179,252)** |
| **ජංගම වත්කම්** | | | | |
| තොග | 7 | 104,269,949 | 105,136,724 | (866,775) |
| වෙළඳ ලැබිය යුතු දෑ | 8 | 35,169,168 | 35,197,674 | (28,507) |
| තැන්පතු, ඉදිරියට කළ ගෙවීම් සහ වෙනත් ලැබිය යුතු දෑ | 9 | 55,341,054 | 60,271,050 | (4,929,996) |
| ලැබිය යුතු ආදායම් | 10 | 9,518,192 | 3,878,771 | 5,639,421 |
| ස්ථාවර තැම්පතු හා භාණ්ඩාගාර බිල්පත් | 11 | 336,447,850 | 270,119,792 | 66,328,058 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 12 | 25,977,564 | 47,508,725 | (21,531,161) |
| | | **566,723,776** | **522,112,735** | **44,611,041** |
| **මුළු වත්කම්** | | **905,035,010** | **892,603,221** | **12,431,789** |
| **හිමිකම් සහ වගකීම්** | | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 13 | 72,510,000 | 72,510,000 | - |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 95,452,836 | 79,139,711 | 16,313,125 |
| රඳවා ගත් ලාභ | | 619,801,744 | 619,996,764 | (195,020) |
| **මුළු හිමිකම්** | | **787,764,580** | **771,646,475** | **16,118,105** |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම | 14 | 43,937,440 | 40,070,517 | 3,866,923 |
| විලම්භිත බදු | 15 | 34,358,741 | 36,133,599 | (1,774,858) |
| | | **78,296,181** | **76,204,116** | **2,092,065** |
| **ජංගම වගකීම්** | | | | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 3,473,639 | 9,860,871 | (6,387,232) |
| ගෙවිය යුතු ආදායම් බදු | 10 | - | 4,741,904 | (4,741,904) |
| අනිකුත් ගෙවිය යුතු දෑ හා උපචිත වියදම් | 16 | 35,500,610 | 30,149,856 | 5,350,754 |
| | | **38,974,249** | **44,752,632** | **(5,778,383)** |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **905,035,010** | **892,603,222** | **12,431,787** |

සමාගමෙහි මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලය 2007 අංක 7 දරණ සමාගම් පනතෙහි අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කර ඇති බවට සහතික කරමි.

---------------------------------- ----------------------------------

**මූල්‍ය කළමනාකරු** **සාමාන්‍යාධිකාරී**

පිටු අංක 15 සිට 23 දක්වා ඇති පිටුවල ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 5 සිට 14 දක්වා පිටුවල ඇති මූල්‍ය ප්‍රකාශනවල සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීමට බැඳේ.

**අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කරන ලදී.**

**සභාපති**
2020 ජූලි මස 09 දින
**කොළඹදීය**

**විධායක අධ්‍යක්ෂක**
2020 ජූලි මස 09 දින
**කොළඹදීය**

## සී/ස ලංකා පොස්පේට් සමාගම

2020 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

*(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)*

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ඉපැයුම් (නැවත සකසන ලද) | මුළු හිමිකම් |
|---|---|---|---|---|
| **2018 මාර්තු 31 දිනට ශේෂය (කලින් දක්වා තිබූ පරිදි)** | **72,510,000** | **-** | **597,323,858** | **669,833,858** |
| සේවක ණය පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් වෙනස් කිරීම (සටහන 25) | - | - | (3,944,021) | (3,944,021) |
| **2018 අප්‍රේල් 01 දිනට ශේෂය (නැවත සකසන ලද)** | **72,510,000** | **-** | **593,379,837** | **665,889,837** |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය (නැවත සකසන ලද) | - | - | 33,385,378 | 33,385,378 |
| දේ.පි.උ. ප්‍රත්‍යාගණන ලාභය | | 109,916,265 | - | 109,916,265 |
| දේ.පි.උ. ප්‍රත්‍යාගණන මත විලම්භිත බදු | | (30,776,554) | | (30,776,554) |
| විශ්‍රාම ප්‍රතිලාභ මත ආයු ගණන අලාභ | - | - | (1,768,451) | (1,768,451) |
| ලාභාංශ ගෙවීම් | - | - | (5,000,000) | (5,000,000) |
| **2019 මාර්තු 31 දිනට ශේෂය** | **72,510,000** | **79,139,711** | **619,996,764** | **771,646,475** |
| **2019 අප්‍රේල් 01 දිනට ශේෂය** | **72,510,000** | **79,139,711** | **619,996,764** | **771,646,475** |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | 9,786,223 | 9,786,223 |
| දේ.පි.උ. ප්‍රත්‍යාගණන මත විලම්භිත බදු (සටහන 26) | | 16,313,125 | - | 16,313,125 |
| විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණන අලාභ | - | - | (2,981,243) | (2,981,243) |
| ලාභාංශ ගෙවීම් | - | - | (7,000,000) | (7,000,000) |
| **2020 මාර්තු 31 දිනට ශේෂය** | **72,510,000** | **95,452,836** | **619,801,744** | **787,764,580** |

පිටු අංක 15 සිට 23 දක්වා ඇති පිටුවල ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 5 සිට 14 දක්වා පිටුවල ඇති මූල්‍ය ප්‍රකාශනවල සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

**සී/ස ලංකා පොස්පේට් සමාගම**

2020 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

*(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)*

| | 2020 මාර්තු 31 | 2019 මාර්තු 31 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | |
| බදු වලට පෙර ලාභය | 17,777,475 | 28,663,251 |
| **ගැලපීම්,** | | |
| ක්‍ෂයවීම | 34,256,995 | 40,387,668 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම | 7,407,304 | 6,668,795 |
| පොළී ආදායම් | (35,579,877) | (31,570,392) |
| ලාභාංශ ආදායම් | (419,000) | (1,000,000) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **23,442,898** | **43,149,321** |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම** | | |
| තොග | 866,775 | 2,636,829 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 28,507 | (15,979,340) |
| තැන්පතු, ඉදිරියට කල ගෙවීම් සහ වෙනත් ලැබිය යුතු දෑ | 4,929,996 | 782,245 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | (6,387,232) | (1,532,698) |
| අනිකුත් ගෙවිය යුතු දෑ හා උපචිත වියදම් | 5,350,754 | 4,794,846 |
| හානිකරණය සඳහා වෙන්කිරීම | 2,302,687 | 2,302,687 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ (යෙදවූ) මුදල් ප්‍රවාහය** | **30,534,385** | **36,153,889** |
| ගෙවූ ආදායම් බදු/ආර්ථික සේවා ගාස්තු/රඳවාගැනීමේ බදු | (18,372,578) | (4,012,242) |
| විලම්භීත බදු | 14,538,267 | - |
| ගෙවූ විශ්‍රාමික පාරිතෝෂික | (6,521,624) | (5,433,106) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලට යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **20,178,450** | **26,708,541** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | |
| දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම | (4,380,431) | (7,146,545) |
| ප්‍රාග්ධන නොනිම් වැඩ | - | (73,258) |
| ලැබුණු පොළී | 35,579,877 | 31,570,392 |
| කෙටිකාලීන තැන්පතුවල ආයෝජන | (66,328,058) | (33,380,933) |
| ලැබුණු ලාභාංශ | 419,000 | 1,000,000 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(34,709,612)** | **(8,030,344)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| ගෙවූ ලාභාංශ | (7,000,000) | (5,000,000) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලට යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(7,000,000)** | **(5,000,000)** |
| **මුදල් හා මුදල් සමාන දෑ වල වර්ෂය තුළ සිදුවූ ශුද්ධ වෙනස්වීම** | **(21,531,161)** | **13,678,197** |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ | 47,508,725 | 33,830,528 |
| **වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ (සටහන 08)** | **25,977,564** | **47,508,725** |

| වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් සමාන දෑ හි විශ්ලේෂණය | ***Mar 31st 2020*** | ***Mar 31, 2019*** |
|---|---|---|
| | - | - |
| බැංකු සහ අතැති මුදල් | 25,977,564 | 47,508,725 |
| | - | - |
| | **25,977,564** | **47,508,725** |

පිටු අංක 15 සිට 23 දක්වා ඇති පිටුවල ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 5 සිට 14 දක්වා පිටුවල ඇති මූල්‍ය ප්‍රකාශනවල සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

## 1. සංස්ථාපිත තොරතුරු

### 1.1 පොදු තත්ත්වය

රාජ්‍ය පතල් හා ඛණිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීම සඳහා 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර පොදු සමාගම් බවට පත් කිරීමේ පනතට අනුව සීමාසහිත ලංකා පොස්පේට් සමාගම සීමාසහිත වගකීම් සහිත සමාගමක් වශයෙන් 1982 අංක 17 දරණ සමාගම් පනත අනුව 1992 ජූලි 10 වන දින සංස්ථා ගත කරන ලදී. කෙසේ නමුත් මෙම ආයතනය 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇති අතර, ශ්‍රී ලංකාව තුළ පවතී.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 14, නව කැළණි පාලම පාරේ, අංක 73 1/1 දරණ ස්ථානයෙහිද, පාෂාණමය පොස්පේට් (ඇපටයිට්) නිධිය එප්පාවලද පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ බහු වාර්ෂික භෝග සඳහා පොහොර වශයෙන් යොදා ගන්නා පොස්පේට් කැනීම සිදු කිරීම, සකස් කිරීම, හා පාෂාණ අලෙවි කිරීමයි. මීට අමතරව සමාගම විසින් පොහොර මිශ්‍ර කිරීමේ මෙහෙයුම් ක්‍රියාවලියක් 2014 වර්ෂයේදී වාරියපොළ කනත්තේවැවදී ආරම්භ කරන ලදී.

### 1.3 වාර්තාකරණ කාලපරිච්ඡේදය

2019.04.01 දින සිට 2020.03.31 දින දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය වාර්තා වලින් ආවරණය කරනු ලබයි.

### 1.4 නිකුත් කිරීම සඳහා අනුමැතිය දුන් දිනය

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට 2020 ජූලි 09 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය දෙන ලදී.

## 2. 0 පිළියෙළ කිරීමේ පදනම

### 2.1 අනුකූලවීමේ ප්‍රකාශනය

සමාගමේ මූල්‍ය ප්‍රකාශන (මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය සමඟ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන්වල සාරාංශ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAS සහ SLFRS) වලට අනුව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වන ලෙස පිළියෙල කර ඇත.

### 2.2 මැනීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අඩංගු පහත සඳහන් ප්‍රමාණාත්මක අයිතමයන් හැර මූල්‍ය ප්‍රකාශන, ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන පිළියෙල කර ඇත.

විකිණීම සඳහා තබා ඇති මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට මනිනු ලබයි.

- ආර්ථික ප්‍රතිලාභ බැඳියාවේ වගකීම වර්තමාන වටිනාකමට හඳුනා ගනී.
- සමාගමට ආදායම් උත්පාදනය කරන්න භාවිතා කරන ලද පොස්පේට් තැන්පතුවේ වටිනාකම විශ්වාසවන්ත ලෙස මිණුම් කිරීමට නොහැකි වූ බැවින් වත්කමක් වශයෙන් මූල්‍ය වාර්තාවල හඳුනාගෙන නොමැත.

## 2.3 ඉදිරිපත් කිරීමේ සහ ක්‍රියාකාරී ව්‍යවහාරික මුදල්

සමාගමේ ඉදිරිපත් කිරීමේ හා ක්‍රියාකාරී ව්‍යවහාර මුදල් ලෙස ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. සියලුම මූල්‍ය ප්‍රකාශන ආසන්නම රුපියලට වැටයූ ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

## 2.4 සංසන්දනාත්මක තොරතුරු

පෙර වර්ෂවල ගිණුම්කරණ ප්‍රතිපත්ති (LKAS 01) - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමිතයට අනුව අඛණ්ඩව යොදාගෙන ඇත.

## 2.5 ප්‍රමාණාත්මකබව හා ඒකරාශි කිරීම

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම (LKAS 01) ප්‍රමිතියට අනුව සෑම ප්‍රමාණාත්මක සමාන අයිතම පන්තියක්ම මූල්‍ය ප්‍රකාශන තුළ වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

ස්වභාවය හා ශ්‍රිතය සමාන නොවන අයිතමද ප්‍රමාණාත්මක නම් වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම හිලව් කර ශුද්ධ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කිරීම පහත අවස්ථාවලදී පමණක් සිදුකල හැකියි.

එහි හඳුනාගත් වටිනාකම හිලව් කිරීමට නිත්‍යානුකූලව බලාත්මක කල හැකි අයිතියක් තිබීම.
එහි ශුද්ධ පදනමක් මත පියවීමේ අභිප්‍රායක් තිබීම.

සමකාලීන ලෙස වත්කම් හා වගකීම් උපලබ්ධි කිරීම.

ගිණුම්කරණ ප්‍රමිත හෝ අර්ථකථන මගින් අවශ්‍ය වන විට හෝ අවසර ලබාදෙන විට හෝ ගිණුම් ප්‍රතිපත්තීන් වල නිශ්චිතව අනාවරණය කළ විට හෝ හැර ආදායම් හා වියදම් ආදායම් ප්‍රකාශනය තුළ හිලව් කිරීම කළ නොහැක.

# 3 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තුගත කිරීම් සහ උපකල්පනයන

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනාගතයට අදාල යම් යම් තීරණාත්මක ගිණුම්කරණ උපකල්පනවල භාවිතය අවශ්‍යවේ. තවදුරටත්, සමාගමේ කළමනාකරණය විසින් වාර්තාකරණ කාලය අවසානයේදී අදායම්, වියදම්, වත්කම් සහ වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්වල අනාවරණය කිරීම්වල වටිනාකම් වාර්තා කිරීමට බලපාන විනිශ්චයන් ඇස්තමේන්තු ගත කිරීම් හා උපකල්පන ඇතිකර ගැනීමට අවශ්‍ය වේ.

කෙසේ වුවද උපකල්පන හා ඇස්තමේන්තු ගත කිරීම් පිළිබඳව අවිනිශ්චිතතාවයන් හේතුවෙන්, අනාගත කාල පරිච්ඡේදය තුළ වත්කම් හා වගකීම්වල ධාරණ වටිනාකමට ප්‍රමාණාත්මක ගැලපීම් කිරීමට සිදු වන ප්‍රතිඵල ලැබිය හැකිය. එම නිසා සැබෑ පළපුරුද්ද හා ප්‍රතිඵලය මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තු වලට වඩා වෙනස්විය හැකිය.

සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඇතුලත් කිරීමේ ක්‍රියාවලියේදී මූල්‍ය ප්‍රකාශන තුළ වටිනාකම් හඳුනාගැනීමේදී වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇතිකරන පහත සඳහන් විනිශ්චයන්, තක්සේරු හා උපකල්පන කළමනාකරණය විසින් ගනු ලබයි.

### a) බදුකරණය

සමාගම අදායම් බදු සහ අනෙකුත් බදු වලට යටත්වේ. ප්‍රවර්ථන බද්ද, විලම්භිත බද්ද සහ අනෙකුත් බදු සඳහා වන මුළු ප්‍රතිපාදනයන් නිශ්චය කිරීමේදී ප්‍රමාණාත්මක විනිශ්චයන් අවශ්‍ය වන අතර, මේ සඳහා මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අනුව අවශ්‍ය ගැලපීම් කිරීමේදී සහ බදු නිශ්චය කිරීම සඳහා බදු වන ලාභය ගණනය කිරීමේදී විසදුම් ලැබීමට ඇති බදු නිර්දේශයන්ද අදාළ කරගත යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාවේදී අදාළ වන බදු නීතීන් හි අර්ථකතනයන් පිළිබඳව යම් යම් අවිනිශ්චිතතාවයන් පැවතිණි.

සමාගම වර්තමාන, විලම්භිත සහ වෙනත් බදු සඳහා වත්කම් හා වගකීම් හඳුනාගනුයේ අතිරේක බදු පවතීද යන තක්සේරුව මත වේ. අවසාන බදු ප්‍රතිඵලයේ වගකීම මූලික සටහන් වලින් වෙනස්වීමේදී, එම වෙනස තීරණය කරන ලද කාලපරිච්ඡේදය තුළ ආදායම්, විලම්භිත සහ බදු වටිනාකමට බලපානු ලබයි.

## b) දේපළ සහ උපකරණ වල ඵලදාය ජීවිත කාලය

සුන්බුන් අගය, ඵලදායි කාලය හා වත්කම් ක්ෂය කිරීමේ ක්‍රමය විමර්ශණය කරයි. කළමනාකරණයේ විනිශ්චයන් මත වටිනාකම් අනුපාත ක්‍රම භාවිතා කරනු ලබන අතර එමනිසා ඔවුන් අවිනිශ්චිතාතාවයන්ට යටත්වේ.

## c) අඛණ්ඩ පැවැත්ම

සමාගම විසින් සමාගමේ පවත්වාගෙන යාමේ හැකියාව නොහොත් අඛණ්ඩ පැවැත්ම තක්සේරු කරනු ලබන අතර ව්‍යාපාරය අනාගත අවිනිශ්චිත කාලයක් අඛණ්ඩව කරගෙන යාමට අවශ්‍ය සම්පත් තිබේද යන්න පිළිබඳවද සලකා බලයි.

තවදුරටත් ක්‍රියාකාරී ව්‍යාපාරයක් ලෙසට දිගින් දිගටම පවත්වා ගැනීමට ඇති හැකියාව පිළිබඳව සාධාරණ සැකයක් ජනිත විය හැකි කිසියම් වූ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලයට දැනීමක් නොමැත. එසේ හෙයින් සමාගමේ ක්‍රියාකාරකම් නවතා දැමීමට හෝ ඇවර කිරීමට අදහසක් නොමැත.

එමනිසා මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කරනු ලබයි.

## d) ශේෂ පත්‍ර දිනට පස සිදුවීම්

2020 මාර්තු 31 දින ප්‍රතිඵලයට ප්‍රමාණාත්මක බලපෑමක් කළ හැකි ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් වාර්තා වී නොමැත.

## e) මූල්‍ය වත්කම් මත හානිකරණ අලාභ

විස්තීරණ අදායම් ප්‍රකාශය තුල හානිකරණ අලාභ වාර්තා කිරීම සඳහා යම්කිසි හරයාත්මක සාක්ෂි පවතීද යන්න පිළිබද සෑම වාර්තාකරණ දිනයකදීම හෝ නිරන්තරව සමාගම විසින් ඇගයීමක් සිදු කරයි.

## f) විකිණීම සඳහා පවතින ආයෝජනවල හානිකරණය

සමාගම විසින් සෑම වාර්තාකරණ දිනයකදීම විකිණීම සඳහා පවතින ආයෝජන ලෙස හඳුන්වන කොටස් අරමුදලට ලබා දී ණය හානිකරණය වී ඇතිද යන්න විමර්ශනය කරයි.

මේ සඳහා ණය සහ තැන්පතුවල තනි අගයන් සඳහා යොදාගත් තක්සේරු කිරීම සමාන විය යුතුය.

## g) විලම්භිත බදු වත්කම්

විලම්භිත බදු වත්කම් හඳුනාගනුයේ යම් ප්‍රමාණයකට භාවිතා නොකල බදු අලාභ සහ බදු බැර පවතින බදු අයකළ හැකි ලාභයට එරෙහිව භාවිතා කළ හැකිනම් පමණි. සුදුසු කාලය සහ අනාගත බදු සැලසුම් උපාය මාර්ග සමඟ එක්ව පවතින පදනම මත හඳුනාගත හැකි විලම්භිත බදු වත්කම් සඳහා සැළකිය යුතු කළමණාකරණ විනිශ්චයන් අවශ්‍යවේ.

## h) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වල ප්‍රමිත වටිනාකම ධාරණ අගය තීරණය කරනු ලබන්නේ ආයුගණක උපකල්පන සලකා බලන සූත්‍රයක් භාවිතා කරමින්ය. මෙහි අනාගතයේ සිදුවන සත්‍ය සංවර්ධනයන්ගෙන් වෙනස් විය හැකි විවිධ උපකල්පනයන් ඇතුලත් කිරීම මෙයට ඇතුළත් වේ.

මෙහි ඇතුලත් වනුයේ වට්ටම් අනුපාතවල නිර්ණය කිරීම් අනාගත වැටුප් වැඩිකිරීම්, මරණ අනුපාතය යනාදියවේ. අගය කිරීමේ සංකීර්ණතාවය, පාදකවූ උපකල්පන හා එහි දිගු කාලීන ස්වභාවය හේතු කොටගෙන මෙම උපකල්පන වල වෙනස්වීම නිශ්චිත ප්‍රතිලාභ සැලසුමකදී ඉතා සංවේදී වේ. සියළුම උපකල්පන සෑම වාර්තාකරන දිනයකදීම නිරීක්ෂණය කරනු ලබයි. යෝග්‍ය වට්ටම් අනුපාත තීරණය කිරීමේදී නිශ්චිත ප්‍රතිලාභ බැදියාව බලාපොරොත්තුවන කාලයට යෝග්‍යවන තක්සේරු කරන කල්පිරීම සමග ශ්‍රී ලංකා රාජ්‍ය බැඳුම්කරණ ප්‍රතිලාභ කළමනාකරණය විසින් සලකා බලනු ලබයි. සමාගමේ අපේක්ෂිත අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතය සහ අනාගත අපේක්ෂිත උද්ධමන අනුපාතය මත අනාගත වැටුප් වැඩිවීම තීරණය කරයි.

## 4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල සාරාංශය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාගම විසින් යොදාගනු ලබන සැලකියයුතු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත සඳහන් වේ.

විශේෂයෙන් සඳහන් නොවන්නේ නම්, පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අඛණ්ඩව සියළුම කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී යොදාගනු ලබයි.

## 4.1 ආදායම් හඳුනාගැනීම

### 4.1.1 භාණ්ඩ විකුණුම්

සමාගම අදායම් හඳුනාගනු ලබන්නේ එම ආදායමේ සහ ඒ ආශ්‍රිතව දරූ හෝ දරන ලද පිරිවැය වටිනාකම විශ්වාසනීයව හඳුනාගත හැකි විටදී සහ එහි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුලට ගලාඒමේ හැකියාව ප්‍රත්‍යක්ෂ විටදී පමණි. ආදායම මිනුම්කරණය කරනු ලබන්නේ ලද හෝ ලැබිය යුතු ප්‍රතිශ්ඨාවෙ සාධාරණ වටිනාකමින් වෙළඳ වට්ටම් සහ විකුණුම් මත බදු අඩුකල අගයටයි.

පහත සඳහන් සියළුම කොන්දේසි සම්පූර්ණ කරන විට භාණ්ඩ විකුණුම් වලින් ආදායම හඳුනාගනී.

a) විකුණනු ලබන භාණ්ඩ වලට අදාල සියළුම අවදානම් හා ප්‍රතිලාභයන් ගැණුම්කරු වෙත මාරුවනු ලබන අවස්ථාවේද

b) ආයතනය තවදුරටත් අයිතිය සම්බන්ධ කළමනාකරණ මැදිහත් වීමක් හෝ භාණ්ඩ විකිණීම මත ඵලදායි පාලනයක් රඳවාගෙන නොමැති වීම.

c) ආදායමේ වටිනාකම විශ්වාස කළ හැකි ලෙස මැනිය හැකි වීම සහ ගනුදෙනුව හා සම්බන්ධ ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා එන බව, ප්‍රත්‍යක්‍ෂ වූ විටදී : සහ

d) ගනුදෙනුවට අදාලව දැරූ පිරිවැය හෝ දරනු ලබන පිරිවැය විශ්වාසදාය ලෙස මැනිය හැකිවීම.

### 4.1.2 පොළී ආදායම

පොළී ආදායම හඳුනාගනු ලබන්නේ සඵලදායි පොළ අනුපාතය ක්‍රමය භාවිතාකොට ගෙනය (EIR).

### 4.1.3 ලාභාංශ ආදායම

ලාභාංශ ආදායම හඳුනාගනු ලබන්නේ ලාභාංශ ලැබීමේ අයිතිය ලද විට, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල උපචිත පදනමටය.

### 4.1.4 වෙනත් ආදායම

වෙනත් ආදායම් උපචිත පදනමට හඳුනාගනු ලබයි.

## 4.2 වියදම් හඳුනාගැනීම

දරූ පිරිවැය සහ විශේෂිත අයිතමයක ආදායම් ඉපයීම් අතර සෘජු සම්බන්ධයේ පදනම මත වියදම් ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනී.

ව්‍යාපාරය කරගෙන යාමෙදි ඇතිවන සියලුම වියදම් සහ දේපළ, පිරියත උපකරණ ඵලදායි ආකාරයෙන් පවත්වාගෙන යාම තුල ඇතිවන අයකර ගැනීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයතුල හඳුනාගනී. ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණුනින්, සමාගමේ කාර්‍යසාධනයේ සාධාරණ අගය ඉදිරිපත් කිරීමේ පදනම මත "වියදම් ශ්‍රිත", ක්‍රමය පවත්වාගෙන යයි.

ආදායම් බදු වියදම් තුළ ජංගම හා විලම්භිත බදු ඇතුලත්වේ. ආදායම් බදු වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනී.

## 4.3 බදු

### 4.3.1 ජංගම බදු

ජංගම බදු වත්කම් හා වගකීම් තුල ප්‍රවර්ථන වර්ෂය සඳහා දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාලගෙන් අයවියයුතු හෝ ගෙවියයුතු සහ පෙර වසර සඳහා ගැලපීමක් සිදු කළ යුතු නම් එය ඇතුළත් වේ. වාර්තාකරණ දිනට නිතීගත කර ඇති හෝ ඊට පසුව නිතිගත කර ඇති බදු නීති සහ බදු අනුපාත යොදා ගනිමින් වටිනාකම ගණනය කරනු ලබයි.

### 4.3.2 විලම්භීත බදු

විලම්භීත බදු පනවනු ලබන්නේ මුල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා බදුවල ධාරණ අගය සහ වත්කම් සහ වගකීම් වල බදු පදනම අතර වාර්තාකරන දිනට පවතින තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමය යොදාගනිමින්ය.

සියළුම අඩුකළ හැකි වෙනස්කම් සඳහා විලම්භීත බදු වත්කම් හදුනාගනී. භාවිතා නොකරන බදු බැර වල ඉදිරියට ගෙනයාම සහ භාවිතා නොකළ බදු අලාභ යම් ප්‍රමාණයකට අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් පවතින බදු අයකල හැකි ලාභයට එරෙහිව ලබාගත හැකි බව හෝ භාවිතා නොකළ බදු අලාභ හා භාවිතයට නොගත් බදු ගෙවීම් භාවිතා කල හැකි විය යුතුයි.

සෑම වාර්තාකරණ දිනකටම විලම්භීත බදු වත්කමේ ධාරණ අගය විමර්ශනය කරනු ලබන අතර, විලම්භීත බදු වත්කමේ මුළ අගය හෝ කොටසක් ප්‍රමාණවත් බදු අයකළ හැකි ලාභයෙන් තවදුරටත් යම් ප්‍රමාණයක් දක්වා අඩුකරනු ලබයි. හදුනා නොගත් විලම්භීත බදු වත්කම් සෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයකම නැවත අගය කරනු ලබන අතර, අනාගත බදු අයකළ හැකි ලාභය, විලම්භීත බදු වත්කම ආවරණය කර ගැනීමට ඉඩදේ නම්, තවදුරටත් යම් ප්‍රමාණයකට හදුනාගත හැකිය. විලම්භීත බදු වත්කම් හා වගකීම්, නීතිගත කරන ලද හෝ පසුකාලිනව නීතිගත කරන ලද, බදු නීතිරීති සහ බදු අනුපාතවලට අනුව වත්කම් හදුනාගැනීම හෝ වගකීම් නිරාකරණය කරගත් විට, වර්ෂය තුළ යොදාගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතයට අගය කරනු ලබයි.

## 4.4 මූල්‍ය නොවන වත්කම

### 4.4.1 දේපළ සහ උපකරණ

#### හදුනාගැනීම සහ මැනීම

වත්කම් ආශ්‍රිතව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරයට ගලා ඒමේ ප්‍රවණතාවක් පවතී නම් සහ වත්කමේ පිරිවැය LKAS 16 දේපළ, පිරියත හා උපකරණ ප්‍රමිතයට අනුව විශ්වාසදායීව මැනිය හැකිවිට දේපළ සහ උපකරණ හදුනාගනු ලබයි. මූලිකවම දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට මිණුම් කරයි.

#### පිරිවැය ආකෘතිය

දේපළ සහ උපකරණ දෛනික සේවා පිරිවැයන් සහ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරන වටිනාකම අඩුකර පිරිවැයට ප්‍රකාශ කරනු ලබයි. හදුනාගන්නා ලද උපමානයන් හමුවුනහොත් ප්‍රතිස්ථාන පිරිවැය එම පිරිවැය දැරුවිට එම පිරිවැය තුළ ඇතුලත් කරයි.

#### පසුකාලින පිරිවැය

පසුකාලින පිරිවැය ඇතිවනුයේ ව්‍යාපාරය පවත්වාගෙන යාමේ හෝ වත්කම් ඉපැයීමේ හැකියාව වර්ධනය කිරීමේ අදහසින් පසුකාලීනව දරන ලද ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම්, දිර්ඝ කිරීම හෝ වැඩිදියුණු කිරීම් වන අතර, මේවා ප්‍රාග්ධන වියදම් ලෙස සැළකේ. එවැනි වියදම් වත්කමේ ධාරණ අගය තුළ හදුනාගනී. දේපළ, පිරියත උපකරණ වල දෛනිකව ඇතිවන සේවාවල පිරිවැය ආදායම් ප්‍රකාශය තුළ හදුනාගනියි.

#### ක්‍ෂයවීම්

සරල මාර්ග ක්‍රමය භාවිතා කොට දේපළ සහ උපකරණ වල පිරිවැය සුන්බුන් අගය දක්වා එලදායි ජීවිතකාලය පුරා ලියා හරිමින් ක්‍ෂයවීම් ගණනය කරයි. මිලදී ගැනීමේ දිනයේ සිට අත්තිකාරම් පදනම මත ඉවත් කිරීම දක්වා ක්‍ෂය වීම සිදුකරයි. ඉඩම් ක්ෂය නොකරයි.

තක්සේරු කරන ලද ඵලදායී ජීවිත කාලය මත ක්ෂය අනුපාත පහත දැක්වේ.

| **වත්කම් වර්ගය** | **ක්ෂය ප්‍රතිශතය (%)** |
|---|---|
| ගොඩනැගිලි | 4 |
| යන්ත්‍ර හා පිරියත | 10 |
| රසායනාගාර උපකරණ | 10 |
| විදුලි උපකරණ | 10 |
| විවිධ වත්කම් | 10 |
| මෝටර් වාහන | 20 |
| කාර්යාල උපකරණ | 20 |
| ලීබඩු හා සවිකිරීම් | 20 |
| පරිගණක දෘඩාංග හා මෘදුකාංග | 20 |
| ඉඩම් වැඩි දියුණු කිරීම | 05 |

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම දේපළ, පිරියත හා උපකරණවල සුන්බුන් අගය, ඵලදායී ජීවිතාකාලය හා ක්ෂය කිරීමේ ක්‍රමය සළකා බලන අතර ඒ සඳහා සංශෝධනයක් අවශ්‍ය නම් සිදුකරනු ලබයි. තාක්ෂණික වෙනස්වීමක් මත හෝ වෙනයම් හේතුවක් මත කිසියම් වත්කමක වටිනාකම සැළකිය යුතු ලෙස වෙන්වුනි නම් අදාළ අයිතමයේ ස්වභාවය හා වටිනාකම මත ක්ෂය කිරීම ගැලපෙන අනුපාතයට සිදුකිරීම හෝ සමාගමේ ලාභයට එරෙහිව කපාහැරීම සිදුකළ යුතුයි. (උදා : ජංගම දුරකථන, කැමරා)

වත්කමක වටිනාකම රු. 5,000 ක් ඉක්මවන්නේ නම් එය මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කමක් ලෙස සළකයි. රු.5,000 කට අඩු වත්කම් ලාභයට එරෙහිව කපාහරිනු ලැබේ. අනාගතයේදී සත්‍යාගණනය සඳහා අදාළ දෙපාර්තමේන්තු මගින් ලේඛනයක් පවත්වාගෙන යයි.

### ප්‍රති හඳුනා ගැනීම

දේපළ හා උපකරණ භාවිතා කිරීමෙන් හෝ විකිණීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැති නම් ඒවා හඳුනා නොගනී. වත්කම් ප්‍රති හඳුනා ගැනීම මත ඇති වන ලාභය හෝ අලාභය (ශුද්ධ විකුණුම් වටිනාකම සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරයි) වත්කම් ප්‍රති හඳුනා ගැනීම වර්ෂය තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ "වෙනත් මෙහෙයුම් ආදායම්" යටතේ හඳුනාගනු ලබයි.

## 4.4.2 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සමාගම විසින් සෑම ගිණුම් කාලච්ඡේදයක් අවසානයේදීම එහි වත්කම්හි හානිකරණය සිදුකිරීම සඳහා ඇඟවීමක් ඇත්ද යන්න පිළිබඳ විවරණයක් සිදු කරයි. කිසියම් ඇඟවීමක් පවතින්නේ නම්, හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂාවක් අවශ්‍යවන විට, සමාගම විසින් වත්කමේ නැවත අයකරගත හැකි අගය ඇස්තමේන්තු කරයි.

## 4.5 මෙහෙයුම් බදු

කල්බදු හිමියා විසින් කල්බදු කාලය පුරා අයිතියේ ප්‍රතිලාභ සහ සියළුම පසුකාලීන අවදානම් ඵලදායීව රඳවා ගනී නම් එවැනි බදු මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කරයි. මෙහෙයුම් කල්බදු ගෙවීම කල්බදු කාලය පුරා සරල මාර්ග ක්‍රමයට වියදමක් ලෙස හඳුනාගැනීම හෝ කල්බදු වත්කම් භාවිතා කිරීමෙන් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ ගලාඑන කාල පිළිවෙලේ නිරූපණය මත හඳුනාගනු ලබයි.

## 4.6 තොග

සාමාන්‍ය තොග අගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් වලින් අඩු අගයට ප්‍රකාශ කරයි. නිෂ්පාදන පිරිවැය මත පදනම්ව හරිත සාමාන්‍ය පදනම මත පිරිවැය හඳුනාගනී. පොස්පේට් තොග අගය කරන විට නිධි පිරිවැයෙන් 40% ක්ද ඇඹරුම් (සකස් නොකළ) නිෂ්පාදනයටද ඉතිරි 60% ක් සකස් කළ නිෂ්පාදනයටද විභජනය කිරීම භාවිතයේ පවතී. ශුද්ධ උපලබ්ධි අගය වනුයේ පිරිවැය උපලබ්ධි කිරීම සඳහා අවසර දීමෙන් පසුව, සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීමට තබා ඇති තොගවල මිල ගණන් අනුවය. යල්පැනගිය, මන්ද සංචලන සහ දෝෂ සහිත තොග සඳහා අවශ්‍ය වෙන්කිරීම් සිදුකරනු ලබයි.

## 4.7 හානිකරණ හඳුනාගැනීම, මැණීම සහ තක්සේරු කිරීම

සෑම වාර්තාකරණ දිනයකදීම සමාගම විසින් මූල්‍ය වත්කම්වල සාධාරණ අගයට ලාභ අලාභයට ගෙන නොමැති හානිකරණ වල හරාත්මක සාක්ෂි පවතීද නැද්ද යන්න තක්සේරු කරයි. වත්කම් වල මූලික හඳුනාගැනීමට පසුව අලාභ ඇතිවන අවස්ථා හටගැනීමක් හරාත්මක සාක්ෂි මඟින් ඔප්පුකරන විට සහ වත්කමක අනාගත මුදල් ගැලීමක් මත අලාභ අවස්ථාවක් ඇතිවීම සාධාරණව තක්සේරු කල හැකිවිට මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමාගමක හානිකරණයක් ඇතිවේ.

සමාගමට එකතුකල නොහැකි බවට සනාථ කර ඇති විට සමාගම විසින් ආයෝජන සුරැකුම්පත් සහ ණය අත්තිකාරම් ලියාහරිනු ලබයි.

## 4.8 මුදල් හා බැංකු ශේෂ

මුදල් හා බැංකු ශේෂ හඳුනාගනු ලබන්නේ අතැති මුදල් සහ බැංකු ශේෂ වශයෙන්ය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා මුදල් සහ මුදල් සමාන දෑ වල, අතැති මුදල් සහ බැංකු අයිරාවේ නොගෙවූ ශුද්ධ අගය අඩු කල පසු බැංකු තැන්පතු අන්තර්ගත වේ. කෙටිකාලීන කල්පිරීම් සහිත ආයෝජන, උදාහරණ වශයෙන් මාස තුනක් හෝ අත්පත්කර ගත්දින සිට මාස තුනට අඩු ආයෝජන, මුදල් සමාන දෑ ලෙස හඳුන්වයි.

## 4.9 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස්, හිමිකම් ලෙස වර්ගකරයි. හිමිකම් සාධන පත්‍ර, මුදලේ සාධාරණ අගයට හෝ වෙනත් වත්කම් ලැබීම හෝ ලැබිය යුතු දෑ, හිමිකම් සාධන පත්‍ර නිකුත්කිරීමේ සෘජු ශුද්ධ පිරිවැයට මනිනු ලබයි.

## 4.10 විශ්‍රාම ප්‍රතිලාභ බැදියාව

### 4.10.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම - පාරිතෝෂික

සමාගම 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත අනුව පාරිතෝෂික ගෙවීමට බැදී සිටී. පාරිතෝෂිකය ගෙවීමට ඇති වගකීම් අනුව අඛණ්ඩව අවුරුදු 05 ක සේවා කාලයක් සම්පූර්ණ විය යුතුය. එම පනත යටතේ සමාගමේ වගකීම නිවැරදි උපකල්පන මත ගොඩනැගූ සූත්‍රය (ප්‍රක්ෂිප්ත) මත පදනම් වේ. උපකල්පන හා ක්‍රමවේදය මත ගණනය කල සේවකයින්ගේ 2020 මාර්තු 31 දිනට විශ්‍රාම ප්‍රතිලාභ බැදියාව මත වූ වර්තමාන අගය රු.43,937,440.00 කි. එමෙන්ම විශ්‍රාම ප්‍රතිලාභ මත වූ වර්තමාන අගය 2019 මාර්තු 31 දිනට රු. 40,070,517.00 ක් විය. එම වගකීම බාහිර අරමුදලක් ලෙස ලංකා බැංකුවේ ග්‍රෑන්ඩ්පාස් ශාඛාවේ ස්ථාවර තැන්පතුවක් ලෙස පවතී. වර්ෂ අවසාන වන විට එම ස්ථාවර තැන්පතුවේ වටිනාකම රුපියල් 62,711,860.89 කි. එක් එක් වර්ෂය අවසානයේ දී තීරණය කරන ලද වගකීම් මත වාර්ෂිකව ආයෝජනය කරනු ලබන මුදල වාර්ෂිකව සමාලෝචනය කෙරේ.

### 4.10.2 නිශ්චිත දායක සැලසුම

නිශ්චිත දායක සැලසුමක් යනු වෙනමම ඒකකයක් තුල ස්ථිර දායකයක් ගෙවන සහ අමතර වටිනාකම් ගෙවීමට නීතිමය හෝ නිර්මාණාත්මක බැදියාවක් නොමැති පසු සේවක ප්‍රතිලාභ සැලසුමකි. නිශ්චිත දායක සැලසුම් දායකත්වය සඳහා බැදියාව හඳුනාගනු ලබන්නේ සේවකයා සේවය කරන කාලයතුල, ආදායම් ප්‍රකාශයේ සේවක ප්‍රතිලාභ වියදම් වශයෙන්ය.

#### a. සේවක අර්ථසාධක අරමුදල

අනුමත අර්ථසාධක අරමුදලට සෑම සේවකයෙකුගේම වැටුප මත සමාගමේ හා සේවකයාගේ දායකත්වය 12% 10% වශයෙන් වේ.

#### b. සේවක භාරකාර අරමුදල

සමාගම විසින් සෑම සේවකයෙකුගේම වැටුප්මත **3%** ක දායකත්වයක් සේවක භාරකාර අරමුදලට යොදයි.

## 4.11 වෙන් කිරීම

වෙන්කිරීම් හදුනාගනුයේ සමාගමේ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳියාවක් (නීතිමය හෝ නිර්මාණාත්මක) පවතින විට සහ බැඳියාව නිරාකරණය කිරීමේදී ආර්ථික ප්‍රතිලාභ ජනිත කරන සම්පත් පිටතට ගලායාමේ හැකියාවක් පවතින හා බැදීම විශ්වාසදායකව මැනිය හැකි විටදීය. ඕනෑම වෙන් කිරීමකට අදාල වියදම් ප්‍රතිපූර්ණයන් අඩු කළ පසු ආදායම් ප්‍රකාශනය තුළ ඉදිරිපත් කරයි.

## 4.12 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

LKAS 07 - මුදල් ප්‍රවාහ ප්‍රකාශය, යන ප්‍රමිතයේ නියමයන් අනුකූලව වක්‍ර ක්‍රමය යොදාගනිමින් සකස් කර ඇත. මුදල් හා මුදල් සමාන දෑ වල අතැති මුදල්, බැංකු මුදල් සහ බැංකු අයිරා අඩංගු වේ.

## 4.13 ඛණ්ඩමය තොරතුරු

ඛණ්ඩයක් යනු සේවා සැපයීම තුළ නියැලෙන හදුනාගත හැකි අංගයන් වන අතර වෙනත් අංගයන්ගේ වෙනස්වූ අවධානම් සහ ප්‍රතිලාභවලට හිමිකම් ලබයි. වෙන් වශයෙන් හදුනාගතහැකි අංගයන් අඛණ්ඩයන් සමාගම සතුව නොමැති බැවින් සියළුම මෙහෙයුම් එක් ඛණ්ඩයක් ලෙස සලකනු ලබයි.

***(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)***

## 5. දේපළ, පිරියත හා උපකරණ

| පිරිවැය / ප්‍රත්‍යාගණනය | 2019 අප්‍රේල් 01 දිනට ශේෂය | එකත කිරීම් නැවත ඇගයීම | ඉවත් කිරීම | 2020 මාර්තු 31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ගොඩනැගිලි | 146,712,500 | 2,229,834 | - | 148,942,334 |
| අභ්‍යන්තර මාර්ග | 65,139,730 | - | - | 65,139,730 |
| යන්ත්‍ර හා පිරියත | 100,399,984 | 49,000 | | 100,448,984 |
| මෝටර් වාහන | 63,515,000 | - | - | 63,515,000 |
| කාර්යාල උපකරණ | 6,903,452 | 140,088 | - | 7,043,539 |
| විදුලි උපකරණ | - | 354,784 | - | 354,784 |
| ලීබඩු හා සවිකිරීම් | 6,764,059 | 631,375 | | 7,395,433 |
| පරිගණක දෘඩාංග හා මෘදුකාංග | 3,031,715 | 975,350 | - | 4,007,065 |
| | **392,466,440** | **4,380,430.88** | **-** | **396,846,870** |

| ක්ෂයවීම් | 2019 අප්‍රේල් 01 දිනට ශේෂය | වර්ෂය සඳහා අය කිරීම් | මාරු කිරීම | 2020 මාර්තු 31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ගොඩනැගිලි | - | 5,868,500 | - | 5,868,500 |
| අභ්‍යන්තර මාර්ග | 16,141,152 | 3,256,987 | - | 19,398,138 |
| යන්ත්‍ර හා පිරියත | - | 8,890,288 | | 8,890,288 |
| මෝටර් වාහන | - | 12,703,000 | - | 12,703,000 |
| කාර්යාල උපකරණ | - | 1,404,083 | - | 1,404,083 |
| විදුලි උපකරණ | - | 13,653 | - | 13,653 |
| ලීබඩු හා සවිකිරීම් | - | 1,410,578 | | 1,410,578 |
| පරිගණක දෘඩාංග හා මෘදුකාංග | - | 709,906 | - | 709,906 |
| | **16,141,152** | **34,256,995** | **-** | **50,398,147** |

| ශුද්ධ පොත් අගය | 2019 අප්‍රේල් 01 දිනට ශේෂය | වර්ෂය සඳහා අය කිරීම් | | 2020 මාර්තු 31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ගොඩනැගිලි | 146,712,500 | (3,638,666) | - | 143,073,834 |
| අභ්‍යන්තර මාර්ග | 48,998,578 | (3,256,987) | - | 45,741,592 |
| යන්ත්‍ර හා පිරියත | 100,399,984 | (8,841,288) | - | 91,558,696 |
| මෝටර් වාහන | 63,515,000 | (12,703,000) | - | 50,812,000 |
| කාර්යාල උපකරණ | 6,903,452 | (1,263,995) | - | 5,639,456 |
| විදුලි උපකරණ | - | 341,131 | - | 341,131 |
| ලීබඩු හා සවිකිරීම් | 6,764,059 | (779,203) | - | 5,984,856 |
| පරිගණක දෘඩාංග හා මෘදුකාංග | 3,031,715 | 265,444 | - | 3,297,159 |
| | **376,325,288** | **(29,876,565)** | **-** | **346,448,723** |

| ප්‍රාග්ධන නොනිමි වැඩ | 2019 අප්‍රේල් 01 දිනට ශේෂය | එකතු කිරීම් | මාරු කිරීම | 2020 මාර්තු 31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| නව කම්හල ස්ථාපනය කිරීම | 7,440,000 | - | - | 7,440,000 |
| RM වෙළඳ සැල් සඳහා බිත්ති ඉදිකිරීම | - | 2,006,851 | (2,006,851) | - |
| අලුත් වාහන ගැරේජය | 73,258 | - | - | 73,258 |
| | **7,513,258** | **2,006,851** | **(2,006,851)** | **7,513,258** |
| **එකතුව** | **383,838,546** | | | **353,961,981** |
| **හානිකරණය සඳහා වෙන්කිරීම** | **(14,348,061)** | (2,302,687) | - | **(16,650,748)** |
| | **369,490,485** | | | **337,311,234** |

| | ***2019/20*** | ***2018/19*** |
|---|---|---|
| **6. ඉන්වෙස්ට්මන්ට් ඉන් GSMB ටෙක්නිකල් සර්විස් (පුද්ගලික) සමාගම**<br>රුපියල් 10 බැගින් වූ කොටස් 100,000 | **1,000,000** | **1,000,000** |

## සී/ස ලංකා පොස්පේට් සමාගම

2020 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්

*(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)*

| | 2020 මාර්තු 31 | 2018/2019 |
|---|---|---|
| **7 තොග** | | |
| වෙළඳ තොග - එප්පාවල (අවසාන නිමි තොග) | 32,662,585 | 18,090,780 |
| (අමුද්‍රව්‍ය තොග) | 16,364,752 | 12,658,575 |
| වෙළඳ තොගය - වාරියපොළ | 1,059,137 | 2,608,619 |
| උපලබ්ධි නොවූ ලාභ සඳහා වෙන්කිරීම | (130,278) | (171,909) |
| සාමාන්‍ය තොග | 58,122,084 | 75,758,991 |
| | **108,078,280** | **108,945,055** |
| **යල්පිනූ තොග සඳහා වෙන්කිරීම** | (3,808,331) | (3,808,331) |
| | **104,269,949** | **105,136,724** |
| **8 වෙළඳ ලැබිය යුතු දෑ** | | |
| ණයගැතියෝ ERP/HERP අලෙවිය - එප්පාවල | 43,800,784 | 42,892,784 |
| මුදලට විකුණුම් එකතුකිරීමේ ගිණුම - එප්පාවල | (10,640) | (88,100) |
| ණයගැතියෝ - පොල් පොහොර ව්‍යාපෘතිය | 1,947,027 | 2,800,645 |
| (-) බොල් හා අඩමාණ ණය සඳහා වෙන්කිරීම | (10,568,004) | (10,407,656) |
| | **35,169,168** | **35,197,674** |
| **9 තැන්පතු, කලින් ගෙවීම හා වෙනත් ලැබිය යුතු දෑ** | | |
| සේවක ණය සහ අත්තිකාරම් | 40,373,710 | 44,128,562 |
| තැන්පතු සහ ඉදිරියට ගෙවීම් | 2,093,333 | 4,389,811 |
| කෙටිකාලීන ආයෝජන වලින් ලැබිය යුතු (ස්ථාවර තැන්පතු) පොළී ආදායම | 12,874,011 | 11,721,935 |
| කෙටිකාලීන ආයෝජන වලින් ලැබිය යුතු (රෙපෝ) පොළී ආදායම | | 30,742 |
| | **55,341,054** | **60,271,050** |
| **10 විලම්භිත බදු** | | |
| **වර්ෂය ආරම්භක ශේෂය** | 2,274,594 | 4,875,373 |
| (+) වර්ෂය සඳහා ප්‍රතිපාදන | 447,223 | (133,469) |
| (-) වර්ෂය තුළ ගෙවීම් | (2,721,817) | - |
| | **-** | **4,741,904** |
| **තැන්පතු** | | |
| (-) ESC ලැබිය යුතු | (6,994,237) | (2,467,310) |
| (-) රඳවා ගැනීමේ බදු | (2,523,955) | (1,411,461) |
| වර්ෂය අවසාන ශේෂය | **(9,518,192)** | **863,133** |
| **11 ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්** | | |
| ස්ථාවර තැන්පතු | 336,447,849 | 270,119,791 |
| | **336,447,849** | **270,119,791** |
| **12 මුදල් සහ මුදල් සමාන දෑ** | | |
| රෙපෝ - ලංකා බැංකුව | - | 36,000,000 |
| බැංකුවේ ඇති මුදල් | 25,827,564 | 11,358,725 |
| අතැති මුදල් | 136,000 | 136,000 |
| මුද්දර සංචිතය | 14,000 | 14,000 |
| | **25,977,564** | **47,508,725** |
| **12.1 - බැංකුවේ ඇති මුදල්** | | |
| ලංකා බැංකුව - එප්පාවල (A/C No 004641100) | 1,094,208 | 184,108 |
| මහජන බැංකුව - එප්පාවල (170-100180000025) | 541,022 | 84,040 |
| මහජන බැංකුව - වාරියපොළ - (A/C No 144-100200000025) | 12,200,288 | 8,941,064 |
| ලංකා බැංකුව - ගුෑන්ඩ්පාස් - (A/C No 0009300713) | 11,991,234 | 2,089,335 |
| ලංකා බැංකුව - ගුෑන්ඩ්පාස් - 2 - (A/C no 70951107) | - | 60,178 |
| | **25,826,753** | **11,358,725** |

**සී/ස ලංකා පොස්පේට් සමාගම**

2020 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්

***(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)***

| | 2020 මාර්තු 31 | 2018/2019 |
|---|---|---|
| **13 ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | |
| සාමාන්‍ය කොටස් 7,251,000 | **72,510,000** | **72,510,000** |
| **14 විශ්‍රාමික පාරිතෝෂික බැදීම** | | |
| 2019 අප්‍රේල් 01 දිනට ශේෂය | **40,070,517** | **37,066,377** |
| ප්‍රවර්ථන සේවා පිරිවැය | 2,887,350 | 2,524,774.00 |
| පොළි වියදම | 4,519,954 | 4,144,021 |
| වර්ෂය තුළ ගෙවීම | (6,521,624) | (5,433,106) |
| ආයුගණක (ලාභ)/අලාභ | 2,981,243 | 1,768,451 |
| 2020 මාර්තු 31 දිනට ශේෂය | **43,937,440** | **40,070,517** |
| **15 විලම්භිත බදු** | | |
| වර්ෂය ආරම්භක ශේෂය | 36,133,598.99 | 9,048,248.83 |
| ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගන්නා ලද | 14,538,267.02 | (3,691,203.95) |
| වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගන්නා ලද | (16,313,125.04) | 30,776,554.11 |
| වර්ෂය අවසාන ශේෂය | 34,358,740.97 | 36,133,598.99 |
| **16 අනිකුත් ගෙවිය යුතු ද හා උපචිත වියදම්** | | |
| උපචිත වියදම් | 23,464,321 | 21,074,256 |
| ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු | - | 1,197,863 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 12,036,288 | 7,877,738 |
| | **35,500,610** | **30,149,856** |
| **17 ආදායම** | | |
| ඊ.ආර්.පී. (කි.ග්‍රෑ. 50) | 388,190,020 | 397,972,670 |
| යූරියා විකුණුම් | - | 81,000 |
| එච්.ඊ.ආර්.පී. | 109,098,950 | 111,524,775 |
| පොල් පොහොර විකුණුම් | 12,714,610 | 20,837,197 |
| එම්.ඕ.පී. | - | 559,000 |
| | **510,003,580** | **530,974,642** |

| 18. විකුණුම් මිල | 2019/20 | 2018/19 | වෙනස |
|---|---|---|---|
| **ආරම්භක වෙළඳ තොගය (2019 අප්‍රේල් 01 දිනට)** | **30,749,355** | **35,483,920** | |
| **වර්ෂය තුළ වියදම් මාරු කිරීම** | | | |
| සේවක පාරිශ්‍රමිකය - ක්‍රෂර් | 14,646,265 | 9,496,602 | 5,149,663 |
| බලය - ක්‍රෂර් 1 10% | 131,754 | 133,273 | (1,519) |
| කොන්ක්‍රීට් මික්ෂර් මැෂින් ක්‍රියාකරු | 362,494 | - | 362,494 |
| ක්‍රෂරයේ අමතර කොටස් | 26,109 | 448,585 | (422,477) |
| නව JAW ක්‍රෂරය - නඩත්තු කිරීම | - | 3,000 | (3,000) |
| පුද්ගල ආරක්ෂක උපකරණ | 33,731 | 15,438 | 18,293 |
| ආයුධ සහ මෙවලම් | - | 38,078 | (38,078) |
| ක්ෂය - නිෂ්පාදන | 16,241,221 | 29,456,522 | (13,215,302) |
| පුරස්කාරය | 34,940,008 | 34,933,221 | 6,787 |
| පරීක්ෂණාගාර වියදම් | 109,566 | 14,357 | 95,210 |
| පරීක්ෂණාගාර ගොඩනැගිලි නඩත්තුව | 304,426 | 261,470 | 42,956 |
| සේවක පාරිශ්‍රමික | 74,585,522 | 74,320,609 | 264,914 |
| පොලිෆොපේලීන් ඇසුරුම් | 49,590,480 | 33,517,322 | 16,073,159 |
| බදින කොකු | 407,538 | 396,310 | 11,228 |
| පාලම් තරාදි ගොඩනැගීම | 543 | - | 543 |
| ලිහිසි තෙල් | 1,816,291 | 1,956,333 | (140,042) |
| 5 රෝලරය - සඳහා බලය 75% | 18,709,046 | 18,924,705 | (215,659) |
| කම්හල් නඩත්තුව 3 රෝලරය | 13,665,985 | 7,246,186 | 6,419,799 |
| කම්හල් අමතර කොටස් - 5 රෝලරය (අළුත්) | 2,140,368 | 3,999,322 | (1,858,954) |
| කම්හල් නඩත්තුව 160 TGM | 2,580,044 | 8,897,109 | (6,317,065) |
| ෆෝක්ලිෆ්ට් - ඉන්ධන | 58,217 | 217,079 | (158,862) |
| ෆෝක්ලිෆ්ට් නඩත්තුව | 164,550 | 505,735 | (341,185) |
| වීල්ලෝඩරය නඩත්තුව 30% | 13,708 | - | 13,708 |
| ෆෝක්ලිෆ්ට් ඉන්ධන | 176,284 | 228,294 | (52,010) |
| ෆෝක්ලිෆ්ට් නඩත්තුව | 579,687 | 58,729 | 520,958 |
| ෆෝක්ලිෆ්ට් ඉන්ධන (Uni Carrier) | 328,774 | 133,477 | 195,297 |
| ෆෝක්ලිෆ්ට් නඩත්තුව (Uni Carrier) | 5,688 | 2,333 | 3,354 |
| පුද්ගල ආරක්ෂක උපකරණ | 119,970 | 93,598 | 26,372 |
| ආයුධ සහ මෙවලම් | 1,345,676 | 282,806 | 1,062,870 |
| අසුරන වැසුම් යන්ත්‍ර වියදම් | 85,507 | 60,180 | 25,327 |
| සේවක පාරිශ්‍රමික (ආකරය) | 4,420,443 | 6,095,424 | (1,674,981) |
| වීල්ලෝඩර් ඉන්ධන | 49,046 | 29,225 | 19,821 |
| වීල්ලෝඩර් ඉන්ධන (නව) | 942,034 | 1,096,127 | (154,093) |
| වීල්ලෝඩර් නඩත්තුව | 2,170 | 121,510 | (119,340) |
| 924 කේ වීල්ලෝඩර් ඉන්ධන | 1,207,721 | 1,224,017 | (16,296) |
| 924 කේ වීල්ලෝඩර් නඩත්තුව | 1,488,077 | 703,209 | 784,868 |
| වීල්ලෝඩර් නඩත්තුව (නව) | 865,130 | 265,263 | 599,867 |
| කැනිම් උපකරණ නඩත්තුව | 1,650 | 1,950 | (300) |
| සම්පීඩන නඩත්තුව | 134,673 | 20,087 | 114,586 |
| තෙල් හා ලිහිසි තෙල් | 88,971 | - | 88,971 |
| යන්ත්‍ර සූත්‍ර කුළියට ගැනීම | 8,354,530 | 7,064,617 | 1,289,913 |
| අභ්‍යන්තර මාරුකිරීම - ට්‍රැක්ටරය - 49 - 7541 | 58,291 | 96,250 | (37,959) |
| අභ්‍යන්තර මාරුකිරීම - 46 ශ්‍රී 5636 | 1,108 | 1,115 | (7) |
| ට්‍රේලරය - 44 ශ්‍රී 6600 | 5,357 | - | 5,357 |
| නව ට්‍රැක්ටර් ට්‍රේලරය 1 | - | 18,870 | (18,870) |
| නව වතුර බවුසරය - NCGA 4634 | 5,434 | 3,951 | 1,484 |
| ට්‍රිපරය - NCLR 2146 | 36,091 | 52,407 | (16,316) |
| ට්‍රිපරය - NCLL 6146 | 596,215 | 772,201 | (175,986) |
| ඩ්‍රම්ට්‍රක් - WPLL 9354 | 187,828 | 181,712 | 6,116 |

| | | | |
|---|---|---|---|
| ඩම්ට්‍රක් - NCLS 9309 | 687,311 | 527,147 | 160,164 |
| අභ්‍යන්තර මාරුකිරීම - ට්‍රැක්ටරය - 270-0809 | 41,860 | 269,576 | (227,716) |
| අභ්‍යන්තර මාරුකිරීම - ට්‍රැක්ටරය - 49-2011 | 40,253 | 81,853 | (41,601) |
| අභ්‍යන්තර මාරුකිරීම - ට්‍රැක්ටරය - 44 ශ්‍රී 6603 | 2,685 | 4,034 | (1,349) |
| අභ්‍යන්තර මාරුකිරීම - ට්‍රැක්ටරය - 44 ශ්‍රී 6606 | 2,685 | 3,621 | (936) |
| අභ්‍යන්තර මාරුකිරීම - ට්‍රැක්ටරය - 44 ශ්‍රී 6607 | 14,325 | 1,108 | 13,217 |
| කැනීම් බලපත්‍ර | 7,227,313 | 2,856,992 | 4,370,321 |
| සේවක පාරිශ්‍රමිකය | 33,139,219 | 30,521,530 | 2,617,689 |
| විදුලි ජනක යන්ත්‍ර - ඉන්ධන | 536,166 | 660,793 | (124,627) |
| විදුලිබලය 5.25% | 790,523 | 799,635 | (9,112) |
| විදුලි ජනක යන්ත්‍ර නඩත්තුව | 31,928 | 128,488 | (96,560) |
| ආයුධ සහ මෙවලම් නඩත්තුව | 357,933 | 459,610 | (101,677) |
| උපලබ්ධි නොවූ ලාභ | (41,631) | (288,978) | 247,347 |
| වැඩමුළුව | 78,215 | 112,114 | (33,899) |
| ක්‍රෂරය ගොඩනැගිල්ල | 69,024 | 50,946 | 18,078 |
| කැනීම් කාර්යාලය | 14,191 | 36,718 | (22,527) |
| ජල සැපයුම් නඩත්තුව | 247,821 | 324,153 | (76,333) |
| කම්හල් ගොඩනැගිලි | 154,274 | 837,013 | (682,739) |
| බරමැනීම් තරාදි නඩත්තුව | 69,893 | - | 69,893 |
| වෛද්‍ය යෝජනා ක්‍රමය | 3,888,950 | 3,625,528 | 263,422 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 2,406,862 | 2,284,281 | 122,582 |
| ලෙඩ නිවාඩු මුදල් | 16,475,499 | 14,486,340 | 1,989,159 |
| පාලම් තරාදි නඩත්තු | 323,919 | 451,352 | (127,433) |
| **මුළු වියදම්** | **318,173,438** | **301,622,463** | **16,550,975** |
| | **348,922,792** | **337,106,383** | **11,816,410** |
| **අවසාන වෙළඳ තොගය** 2020 මාර්තු 31 දිනට | (49,027,337) | (30,749,355) | (18,277,982) |
| **විකුණුම් පිරිවැය (LPL)** | **299,895,455** | **306,357,028** | **(6,461,573)** |
| **විකුණුම් පිරිවැය (CFP)** | **21,386,440** | **35,536,695** | **(14,150,255)** |

| **19. කර්මාන්තශාලා සහ පරිපාලන කටයුතු** | **2019/20** | (නැවත සකසන ලද) **2018/19** | වෙනස |
|---|---|---|---|
| සේවක පාරිශ්‍රමිකය | 112,412,770.41 | 112,070,167.95 | 342,602.46 |
| සේවක සුභසාධනය | 10,895,671.81 | 9,920,598.91 | 975,072.90 |
| විදුලිබලය 9.75% | 6,719,445.94 | 6,796,900.92 | (77,454.98) |
| වාහන කුළී | 67,000.00 | 268,385.00 | (201,385.00) |
| ප්‍රවාහන හා යැපීමේ දීමනා | 3,258,310.00 | 3,349,806.00 | (91,496.00) |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 1,048,153.45 | 911,351.51 | 136,801.94 |
| ක්ෂයවීම් ප්‍රධාන කාර්යාලය | 18,015,774.85 | 10,935,308.58 | 7,080,466.27 |
| පොත් හා වාරික ප්‍රකාශන | 56,045.00 | 91,642.08 | (35,597.08) |
| උත්සව වියදම් | 181,180.50 | 156,458.07 | 24,722.43 |
| ආරක්ෂක අයිතම | 11,136.25 | 153,390.00 | (142,253.75) |
| විවිධ වියදම් | 3,049,930.34 | 535,560.84 | 2,514,369.50 |
| ශිෂ්‍ය ශිෂ්‍යත්ව දීමනා | 390,000.00 | 495,000.00 | (105,000.00) |
| තැපැල් හා විදුලි පණිවිඩ | 53,837.00 | 55,062.50 | (1,225.50) |
| සේවක පුහුණුව | 72,250.00 | 6,000.00 | 66,250.00 |
| ගිණි නිවීමේ උපකරණ | 628,302.50 | - | 628,302.50 |
| ප්‍රධාන ගබඩාව | 12,182.81 | 39,864.51 | (27,681.70) |
| ආරක්ෂක නවාතැන | 34,500.00 | 473.00 | 34,027.00 |
| ආරක්ෂක කුටිය 3 (මුරපොල) | 11,290.95 | 1,171.72 | 10,119.23 |
| ආරක්ෂක හා ප්‍රවාහන කාර්යාලය | 1,107.44 | 19,404.31 | (18,296.87) |
| බයිසිකල් ෂෙඩ් | 40,937.93 | - | 40,937.93 |

| | | | |
|---|---|---|---|
| ආපනශාලා හා සුභසාධන ගොඩනැගිලි | 47,545.31 | (18,698.83) | 66,244.14 |
| ඇල ආශ්‍රිත සේවක නිළ නිවාස | 26,210.33 | 4,568.82 | 21,641.51 |
| සාමාන්‍යාධිකාරී නිළ නිවාස | 15,873.08 | 719.95 | 15,153.13 |
| සේවක නිළ නිවාස නගරය | - | 1,251.06 | (1,251.06) |
| සභාපති නිළ නිවාසය | 22,682.23 | 804.63 | 21,877.60 |
| ආරක්ෂක නිළධාරීන්ගේ නිළ නිවාසය | - | 151.72 | (151.72) |
| සේවා ස්ථානය | - | 275.00 | (275.00) |
| ප්‍රථමාධාර ගොඩනැගිලි | - | 3,815.56 | (3,815.56) |
| විදුලි ජනක යන්ත්‍ර ගොඩනැගිලි | 290.00 | 1,677.83 | (1,387.83) |
| ප්‍රධාන කාර්යාලය | 57,034.95 | 68,544.89 | (11,509.94) |
| කාර්යාල නඩත්තුව | 7,850.00 | 2,392.60 | 5,457.40 |
| සේවක විවේක කාමරය - කැනීම් | 19,436.24 | 2,826.88 | 16,609.36 |
| සේවක විවේක කාමරය - කම්හල | 22,417.87 | 25,436.79 | (3,018.92) |
| රියදුරු විවේක කාමරය | - | 5,486.77 | (5,486.77) |
| සාමාන්‍යාධිකාරී / නි.සාමාන්‍යාධිකාරී කාර්යා | 1,233.62 | 25,122.85 | (23,889.23) |
| වැසිකිලි | 52,897.97 | 28,890.63 | 24,007.34 |
| සභාපති/විධායක අධ්‍යක්ෂ නිළ නිවාසය | 15,641.82 | 2,173.95 | 13,467.87 |
| විදුලි මාර්ග නඩත්තුව | 126,178.82 | 413,547.98 | (287,369.16) |
| දුරකථන මාර්ග නඩත්තුව | 102,134.00 | 14,850.00 | 87,284.00 |
| අමුද්‍රව්‍ය ගබඩාව | 20,307.84 | 6,501.23 | 13,806.61 |
| වෛද්‍ය යෝජනා ක්‍රමය | 2,592,633.30 | 2,417,018.66 | 175,614.64 |
| කාර්යාල උපකරණ | 63,852.95 | 62,536.35 | 1,316.60 |
| කාර්යාල නඩත්තුව | 79,937.61 | 73,079.79 | 6,857.82 |
| විදුලි උපකරණ | 240,345.72 | 168,173.44 | 72,172.28 |
| පරිශ්‍රය/සේවා | 781,011.63 | 406,802.20 | 374,209.43 |
| විවිධ වත්කම් නඩත්තුව | - | 12,121.64 | (12,121.64) |
| පරිගණක නඩත්තුව | 516,451.29 | 69,966.53 | 446,484.76 |
| ලීබඩු උපකරණ | 1,860.00 | 19,061.45 | (17,201.45) |
| දුරකථන - 02549121 | 17,494.93 | 116,035.71 | (98,540.78) |
| දුරකථන - 02549290 | 14,378.90 | 32,067.42 | (17,688.52) |
| දුරකථන - 02549400 | 40,554.48 | 56,729.52 | (16,175.04) |
| දුරකථන - 2249601 | 19,324.59 | 25,789.76 | (6,465.17) |
| දුරකථන - 2249647 | 29,821.49 | 27,230.63 | 2,590.86 |
| අනතුරු රක්ෂණය | 867,007.76 | 413,902.73 | 453,105.03 |
| සංක්‍රමණ මාර්ගස්ථ මුදල් රක්ෂණය | 17,623.89 | - | 17,623.89 |
| ස්ථානීය රක්ෂණය | 527,586.71 | 337,096.80 | 190,489.91 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 1,604,574.98 | 1,522,853.79 | 81,721.19 |
| ලෙඩ නිවාඩු මුදල් | 10,983,665.96 | 9,657,559.77 | 1,326,106.20 |
| විගණන ගාස්තු | 891,518.00 | 384,740.00 | 506,778.00 |
| අධ්‍යක්ෂ ගාස්තු | 374,000.00 | 345,100.00 | 28,900.00 |
| අධ්‍යක්ෂ වියදම් | - | 296,150.00 | (296,150.00) |
| ටෙන්ඩර් මණ්ඩල වියදම් | 1,000.00 | 70,000.00 | (69,000.00) |
| විදුලි බලය | 689,004.16 | 753,698.44 | (64,694.28) |
| ADSL ලයින් වියදම් | 203,862.91 | 51,770.16 | 152,092.75 |
| පොදු වියදම් | 478,690.52 | 430,489.28 | 48,201.24 |
| පුවත්පත් සහ වාරික ප්‍රකාශණ | 41,470.00 | 102,930.00 | (61,460.00) |
| කාර්යාල උපකරණ නඩත්තු | 121,212.50 | 43,540.00 | 77,672.50 |
| තැපැල් හා මුද්දර ගාස්තු | 11,425.00 | 12,752.00 | (1,327.00) |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 226,727.50 | 246,467.50 | (19,740.00) |
| වෘත්තීය ගාස්තු | 1,284,038.00 | 1,287,703.85 | (3,665.85) |
| බදු කුළිය ප්‍රධාන කාර්යාලය | 1,152,124.10 | 1,141,507.25 | 10,616.85 |
| ලේකම් ගාස්තු | 276,984.30 | 371,507.75 | (94,523.45) |
| කල්බදු ගාස්තු - ඉඩම් | 508,021.88 | 508,021.88 | - |
| හානිකරණය | 2,302,687.00 | 2,302,686.84 | 0.16 |
| දුරකථන - 459907 | 53,965.65 | 51,073.16 | 2,892.49 |
| දුරකථන - 459908 | 119,619.72 | 123,304.61 | (3,684.89) |

| | | | |
|---|---|---|---|
| දුරකථන - 459906 | 42,576.17 | 62,421.58 | (19,845.41) |
| දුරකථන - 459909 | 10,465.02 | 13,944.09 | (3,479.07) |
| USB අන්තර්ජාල - 0711884200 - සභාපති | 4,044.30 | 8,455.23 | (4,410.93) |
| ප්‍රවාහණ හා යැපීමේ දීමනා | 1,139,728.00 | 1,377,188.00 | (237,460.00) |
| දුරකථන බිල් ප්‍රතිපූර්ණය | 1,441,676.43 | 1,659,583.98 | (217,907.55) |
| ජලය | 35,218.89 | 50,654.04 | (15,435.15) |
| දුරකථන - 4726918 | 25,327.53 | 24,125.36 | 1,202.17 |
| පරිගණක අළුත්වැඩියා | 848,191.67 | 925,932.43 | (77,740.76) |
| පාරිතෝෂික | 7,407,304.00 | 6,668,795.00 | 738,509.00 |
| නීති වියදම් | - | 72,400.00 | (72,400.00) |
| ඩ්‍රම් ට්‍රක් වාහන අංක NCLJ9309 | 197,528.30 | - | 197,528.30 |
| විගණන හා කාර්යාල කමිටු වියදම් | 209,000.00 | 111,000.00 | 98,000.00 |
| වාහන අංක NC GA 1627 | 281,685.29 | 407,795.61 | (126,110.32) |
| වාහන අංක NCJR 9672 | 375,757.37 | 602,332.28 | (226,574.91) |
| වාහන අංක NCJR 9680 | 478,556.11 | 384,859.99 | 93,696.12 |
| වාහන අංක NC PA 7906 | 261,709.02 | 328,438.78 | (66,729.76) |
| වාහන අංක 252-5963 | 64,402.18 | 104,759.58 | (40,357.40) |
| වාහන අංක 154 - 3641 | 1,447.00 | 5,417.24 | (3,970.24) |
| වාහන අංක NCMA-8755 | 444,431.59 | 612,522.97 | (168,091.38) |
| වාහන අංක NCNB 5469 | 286,627.73 | 282,842.24 | 3,785.49 |
| වාහන අංක WPPC 6891 | 672,650.48 | 475,419.38 | 197,231.10 |
| වාහන අංක ඩබල් කැබ් - WPPF 5672 | 1,162,177.69 | 770,259.91 | 391,917.78 |
| වාහන අංක ඩබල් කැබ් - WPPF 5673 | 1,124,123.76 | 1,153,667.22 | (29,543.46) |
| සේවා ස්ථාන ද්‍රව්‍ය | 194,135.13 | 270,238.96 | (76,103.83) |
| වාහන අංක - WPKQ4329 | 1,357,298.62 | 1,246,135.56 | 111,163.06 |
| වාහන අංක - HK-4629 | 6,532.00 | 6,815.36 | (283.36) |
| මෝටර් බයික් අංක - NC BCB 8782 | 6,600.00 | 11,991.11 | (5,391.11) |
| මෝටර් බයික් අංක - NC BCB 8777 | 3,000.00 | 11,991.11 | (8,991.11) |
| IP VPN ගාස්තු | 762,581.89 | 1,177,830.43 | (415,248.54) |
| | **203,476,814.86** | **189,166,172.56** | **14,310,642.31** |

## 20. විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්

| | 2019/20 | 2018/19 | වෙනස |
|---|---|---|---|
| ප්‍රචාරණ | 543,288.75 | 498,874.50 | 44,414.25 |
| විකුණුම් ප්‍රවර්ධනය | 509,492.50 | 437,180.00 | 72,312.50 |
| ව්‍යාපාර ප්‍රවර්ධනය | 120,497.06 | 473,254.00 | (352,756.94) |
| ඛනිජ බදු | 2,484,496 | 2,531,617.38 | (47,121.80) |
| | **3,657,773.89** | **3,940,925.88** | **(283,151.99)** |

## 21. මූල්‍ය පිරිවැය

| | 2019/20 | 2018/19 | වෙනස |
|---|---|---|---|
| බැංකු ගාස්තු | 133,233.67 | 124,824.04 | 8,409.63 |
| ණය පොළිය | - | 352,151.60 | (352,151.60) |
| | **133,233.67** | **476,975.64** | **(343,741.97)** |

*(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)*

| | | 2020 මාර්තු 31 | 2019 මාර්තු 31 |
|---|---|---|---|
| 22 | **අනෙකුත් ආදායම්** | | |
| | විවිධ ආදායම් | 324,737 | 1,390,069 |
| | ලාභාංශ ආදායම | 419,000 | 1,000,000 |
| | ස්ථාවර තැන්පතු පොළී | 30,204,990 | 26,910,059 |
| | සේවක ණය පොළිය | 2,928,709 | 3,057,523 |
| | රෙපෝ පොළී ආදායම | 2,446,177 | 1,839,679 |
| | | **36,323,614** | **34,197,330** |

**මෙහෙයුම් වලින් ලද ලාභය පහත අයිතම අඩුකල පසු දක්වා ඇත**

| | | |
|---|---|---|
| කාර්ය මණ්ඩල පිරිවැය | 303,310,428 | 292,861,104 |
| ක්ෂය | 34,256,995 | 40,391,831 |
| විගණන ගාස්තු | 891,518 | 384,740 |
| අධ්‍යක්ෂ ගාස්තු | 374,000 | 345,100 |
| විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් | 6,521,624 | 5,433,106 |

| | | | |
|---|---|---|---|
| 23 | **ආදායම් බදු** | | |
| | වර්ෂයේ ලාභ මත ආදායම් බද්ද | (6,547,014) | - |
| | විලම්භිත බදු වලින් මාරු කිරීම | 14,538,267 | (3,691,204) |
| | | **7,991,253** | **(3,691,204)** |

| | | | | |
|---|---|---|---|---|
| 23.1 | **ආදායම් බදු වියදම් සැසඳීම** | | | |
| | බදුවලට පෙර ලාභය | | 17,777,475 | 29,694,174 |
| | වෙළඳ නොවන ආදායම් | | (35,998,877) | (32,807,261) |
| | ඉඩදිය නොහැකි වියදම් එකතුව | | 44,148,167 | 47,170,351 |
| | ඉඩදිය හැකි වියදම් එකතුව | | (28,690,609) | (48,947,218) |
| | **ව්‍යාපාරයෙන් තක්සේරු කල හැකි ආදායම** | | **(2,763,843)** | **(4,889,953)** |
| | **වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ආදායම සහ නිදහස් ආදායම** | | **35,998,877** | **32,807,261** |
| | නිදහස් ආදායම | | (419,000) | (1,000,000) |
| | අයකරගත හැකි අලාභය | 23.2 | (35,579,877) | (31,807,261) |
| | **ආයෝජන වලින් තක්සේරු කළ හැකි ආදායම** | | - | - |
| | **මුළු තක්සේරු කල හැකි ආදායම** | | - | - |
| | සුදුසුකම් ලත් ගෙවීම් | | | - |
| | **බදු අය කල හැකි ආදායම** | | - | - |
| | | | - | - |
| | පසුගිය වසර සඳහා ඌණ/(අධි) වෙන්කිරීම | | (6,547,014) | - |
| | | | - | - |
| | **වත්මන් ආදායම් බදු වියදම්** | | **(6,547,014)** | - |

| | | | |
|---|---|---|---|
| **23.2** | **බදු අලාභය** | | |
| | ඉදිරියට ගෙන ආ අලාභය | 48,710,552 | 75,627,859 |
| | අලාභය | 2,763,843 | 4,889,953 |
| | | 51,474,395 | 80,517,812 |
| | වර්ෂය තුළ උපලබ්ධි කරගත් පාඩුව | (35,579,877) | (31,807,261) |
| | ඉදිරි වර්ෂය සඳහා ඉදිරියට ගෙන ගිය අලාභය | **15,894,518** | **48,710,552** |

**24 කොටසක ඉපැයුම (රු.)**

කොටසක සාමාන්‍ය ඉපැයුම/(අලාභය) ගණනය කර ඇත්තේ සාමාන්‍ය කොටස් කරුවන්ට බෙදාහැරිය හැකි ලාභය (අලාභය), වර්ෂය තුළ බරතැබූ සාමාන්‍ය කොටස්වල එකතුවෙන් බෙදීමෙන්ය.

| | | |
|---|---|---|
| සාමාන්‍ය කොටස්කරුවන්ට බෙදා හැරිය හැකි ශුද්ධ ලාභය | 9,786,223 | 33,385,378 |
| වර්ෂය තුල වූ බර තැබූ සාමාන්‍ය කොටස් ගණන | 7,251,000 | 7,251,000 |
| **කොටසක ඉපැයුම (රු.)** | **1.35** | **4.60** |

## 25 සේවක ණය සඳහා ගැලපීම - සේවක ණය ධාරණ අගය හා ඉදිරියට කල සේවක ගෙවීම්

සමාගම සේවක ණය ක්‍රමක්ෂය ක්‍රමයට ගණනය කිරීමේදී පසුගිය වසර කිහිපය තුළ වැරදි ක්‍රමයක් අනුගමනය කිරීම නිසා සේවක ණය ධාරණ අගය හා ඉදිරියට කළ සේවක ගෙවීම් අධිගණනය වී තිබුණි. තවද ණය පොළිය වැඩියෙන් ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගෙන තිබුණි. එමනිසා, එම වත්කම්වල ආදායම වැඩියෙන් හඳුනාගෙන තිබුණි. මෙම වරද වර්ෂය තුළ හඳුනාගත් අතර (2018/2019) මූල්‍ය ප්‍රතිඵලයට අදාළ ගැලපීම් අතීතයට බලපාන පරිදි සිදුකරන ලදී.

පසුගිය මූල්‍ය වර්ෂයට අදාළ බලපෑම පහත පරදි සාරාංශකර ඇත.

| විස්තරය | ලෙජරයට අනුව ශේෂය | EIR ක්‍රමයට යටත්ව ශේෂය | හිමිකමට බලපෑම |
|---|---|---|---|
| **2018 අප්‍රේල් 01 දිනට ගැලපීම්** | | | ***Impact to Assets*** |
| සේවක ණය | 41,374,563 | 43,031,403 | (1,656,840) |
| ඉදිරියට කල සේවක ගෙවීම් | 5,600,861 | - | 5,600,861 |
| වටිනාකමට කල ගැලපීම් (2019 අප්‍රේල් 01 දිනට) | | | |
| | | | **3,944,021** |
| | | | ***Impact to Equity*** |
| **ඉදිරියට කල සේවක ගෙවීම් - වර්ෂයට ක්‍රමක්ෂය** | 1,030,924 | - | 1,030,924 |
| **2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභය (පෙර වාර්තාකරණ ලද)** | | | **32,354,455** |
| වර්ෂය තුළ ගැලපීම | | | 1,030,924 |
| **2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභය (නැවත සකසන ලද)** | | | **33,385,378** |

## 26 ලාභය නැවත තක්සේරු කිරීමේ සංචිතය මත විලම්භිත බදු -2020.03.31

| | | | |
|---|---|---|---|
| නැවත ඇගයීමේ අතිරික්තය - 2019.04.01 | 109,916,265 | | |
| (-) මෝටර් වාහන සඳහා නැවත තක්සේරු කිරීමේ අතිරික්තය | (53,985,179) | | |
| (-) වර්ෂය තුළ නැවත තක්සේරු කරන ලද ක්ෂය මුදල | (4,275,982) | | |
| | **51,655,104** | 28% | |
| විලම්භිත බදු වගකීම 2020.04.01 දිනට | | | 14,463,429 |
| විලම්භිත බදු වගකීම 2019.04.01 දිනට | | | 30,776,554 |
| **වර්ෂය තුළ ගැලපීම්** | | | **16,313,125** |

## 27. මූල්‍ය අවදානම කළමනාකරණය

වෙළඳපොළ අවදානම් (මුදල් අවදානම පොළී අනුපාත අවදානම සහ මිල මට්ටම් අවදානම් ඇතුලත්ව) ණය අවදානම, ද්‍රවශීල අවදානම් ආදී විවිධාකාර වූ මූල්‍ය අවදානම් වලට සමාගම භාජනය වේ. සමාගමක සමස්ථ අවදානම් කළමනාකරන ක්‍රියාවලිය අවිනිශ්චිත මූල්‍ය අවදානම මත පදනම් වී ඇති අතර සමාගමෙහි මූල්‍ය ක්‍රියාකාරීත්වය මත ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල අවම කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ ප්‍රතිපත්තීන්ට අනුකූලව මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කරනු ලබයි.

සමාගමේ මූලික මූල්‍ය උපකරණ කෙටිකාලීන තැන්පතු, මුදල් වෙළඳපොළ ආයෝජන, සහ මුදල් වලින් සමන්විත වේ. මෙම මූල්‍ය උපකරණ වල ප්‍රධාන අරමුණ වන්නේ සමාගමේ මෙහෙයුම් කටයුතු සඳහා ද්‍රවශීලතාවය වැඩි කිරීම හා පවත්වාගෙන යාම සහ සමාගමේ මූල්‍ය සංචිත මත වූ ප්‍රතිලාභ උපරිම කිරීම වේ. වෙළඳ ලැබිය යුතු, වෙළඳ ගෙවිය යුතු ආදී වූ ව්‍යාපාර කටයුතු වලින් සෘජුව ඇති වූ මූල්‍ය උපකරණ ද සමාගම සතුව ඇත.

### (a) මූල්‍ය අවදානම

මූල්‍ය වත්කම්වල තත්ත්වය (ගුණය) හෝ හානිකරණයක් නොමැතිව තක්සේරු කලහැකි වනුයේ බාහිර ණය අනුපාත (තිබේ නම්) වලට හෝ ප්‍රතිවිරුද්ධ පැහැර හැරීමේ අනුපාත පිළිබඳ අතීත තොරතුරු වලට අනුකූලවය. ණය අවදානම හටගනු ලබනුයේ මුදල් හා මුදල් සමාන දෑ සහ බැංකු හා මූල්‍ය ආයතනවල ඇති තැන්පතු මෙන්ම ගනුදෙනුකරුවන්ගෙන් ලැබීමට ඇති ණය හිඟ ලැබිය යුතු දෑ සහ ඒ හා බැඳුනු ගනුදෙනු ඇතුලත්වය.

### (b) වෙළඳ ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ තුල අන්තර්ගත වී ඇත්තේ දේශීය ගනුදෙනුකරුවන්ය. ඉදිරියට කරගෙන යන ණය අගය කිරීම (විනිශ්චය කිරීම්) ක්‍රියා ත්මක කරනුයේ මූල්‍ය ගිණුම් ලැබිය යුතු දෑ කොන්දේසී මතය. එක් ප්‍රතිවිරුද්ධ පාර්ශවයක් හෝ ප්‍රතිවිරුද්ධ පාර්ශව කණ්ඩායමක් පිළිබඳව සැළකිය යුතු ණය අවදානමක් සමාගම සතුව නැත. සමාගමක් ණය කොන්දේසි අනුමත කිරීමට ප්‍රථම පාරිභෝගිකයා ඇගයීමට ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිහිටුවාගෙන ඇත.

### (c) ද්‍රවශීල අවධානම

මුදල් ප්‍රවාහ පුරෝකථනය කිරීම කරනු ලබන්නේ මූල්‍ය අංශය විසිනි. මෙහෙයුම් අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් මුදල් පවතීද යන්න තහවුරු කර ගැනීමට පුරෝකථනය කල සමාගමක ද්‍රවශීලතා නියමයන්ගේ හැසිරීම මූල්‍ය අංශය අධීක්ෂණය කරයි. කාරක ප්‍රාග්ධන කළමනාකරණය සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා ඇති අතිරික්ත මුදල් ඉහත සඳහන් ශේෂය බැංකු තැන්පතුවල ආයෝජනය කර ඇත. වාර්තාකරන දිනයේදී සමාගම සතුව තැන්පතු රුපියල් 336,447,850 (2019.03.31 රු. 270,119,791) පැවතීය. එය ද්‍රවශීලතා අවධානම් කළමනාකරණය කිරීමෙහිලා පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කර ගැනීමට අපේක්ෂා කරන ලදී.

### (d) පොළී අනුපාත අවදානම

සමාගම සතුව මුදල් හා රාජ්‍ය හා ණය ගෙවීමට හැකි බැංකුවල, මුදල් හා බැංකු ශේෂ ඇත. ප්‍රතිලාභ වක්‍ර හැසිරීම සහ පොළී අනුපාත චලනයන් ක්‍රියාකාරීව අධීක්ෂණය කිරීමෙන් සමාගමට පොළී අනුපාත අවධානම පාලනය කල හැක.

### (e) ප්‍රාග්ධන අවදානම් කළමනාකරණය

ප්‍රාග්ධන කළමනාකරණයෙහිලා සමාගමේ අරමුණ වනුයේ කොටස් හිමියන්ට සහ අනිකුත් පාර්ශවයන්ට ප්‍රතිලාභ ලබාදීම සඳහා ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වාගැනීම තුළින් අඛණ්ඩ පැවැත්මේ හැකියාව ආරාක්ෂා කරගැනීම වේ.

## 28. ප්‍රාග්ධන බැඳීම් හා අසම්භාව්‍ය බැරකම්

පහත දක්වා ඇති දේට අමතරව සැලකිය යුතු ප්‍රාග්ධන බැඳීම් හා අසම්භව්‍ය බැරකම් වලට සමාගම බැඳී නැත.

| | |
|---|---|
| - රඳවාගැනීමේ මුදල් - නව Jaw කෘෂර 2 ක මත (කේෂර ඉංජිනියරින් (පුද්ගලික) සමාගම පිළියන්දල) | Rs. 4,386,358.40 |

## 28.1 මූල්‍යමය බැඳීම්

වාර්තාකරණ දිනට සමාගම පහත සඳහන් මූල්‍යමය බැඳීම්වලට අමතරව සැලකිය යුතු මූල්‍යමය බැඳීම් වලට යටත් නොවේ.

| | රු. |
|---|---|
| - මහවැලි අධිකාරියට ගාස්තු - 2019/2020 නිෂ්පාදිතය මත | 2,522,232.00 |
| - විදුලි බිල්පත් ගෙවීම - මාර්තු 2020 | 1,952,751.50 |
| - යන්ත්‍රෝපකරණ සඳහා ගෙවීම – මාර්තු 2020 | 1,119,900.06 |
| - Royalty Payable Jan – Mar 2020 to GSMB | 7,366,415.40 |

## 28.2 නීතිමය බැඳීම්

නඩු අංක, LPL/COU/03-1 සහ LPL/COU/03-02 යටතේ තුන්වන පාර්ශවයක් විසින් රු. මිලියන 2.5 අලාභයක් ඉල්ලා නඩු පවරා ඇත.

## 29. වාර්තාකරණ කාලයට පසු සිදුවීම්

මූල්‍ය තත්ත්වයේ දිනය ප්‍රකාශයට පත් කිරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ අනාවරණය කිරීම් අවශ්‍ය කිසිදු අවස්ථාවක් ඇතිවී නොමැත.

## 30 සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

## 30.1 ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් සමඟ සිදුවෙන ගණුදෙන

සමාගමේ කටයුතු සැලසුම් කිරීම අධ්‍යක්ෂණය හා පාලනය සඳහා බලය හා වගකිම ඇති පුද්ගලයින් සම්බන්ධිත පාර්ශවයන්ට අයත්වන ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් වේ. ප්‍රධාන කළමනාකරන නිළධාරීන්ට ව්‍යාපාරයේ අධ්‍යක්ෂකවරු ද ඇතුලත්වේ. අවුරුද්ද සඳහා ප්‍රධාන කළමනාකරුවන්ට ගෙවන වේතනය පහත දැක්වේ.

| | 2019/2020 | 2018/2019 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| කෙටිකාලින ප්‍රතිලාභ | 2,515,684 | 2,541,174 |

## 30.2 අනෙකුත් සම්බන්ධිත පාර්ශව සමග සිදු වූ ගණුදෙන


මූල්‍ය වර්ෂය තුළ LKAS 24 යටතේ වෙනත් සම්බන්ධිත පාර්ශව ලෙස හඳුනාගත් ගණුදෙනු ක්‍රියාකාරකම් කිසිවක් නැත

## මෙහෙයුම් ක්‍රියාවලි සමාලෝචනය

2019/2020 වසර සඳහා මෙහෙයුම් සහ මෙහෙයුම් ප්‍රතිඵල මෙන්ම ආයතනයේ අනාගත සැලසුම් පිළිබඳ සංක්ෂිප්ත විශ්ලේශනයක් පහතින් දැක්වේ.


### 01. ලාභ ලැබීමේ හැකියාව

සමාගම වසරකට රු. මිලියන 17.77 ක බදු පෙර ලාභයක් වාර්තා කලේය. ගිය වසරේදී එම බදු පෙර අලාභය රු.මිලියන 29.69 ක් විය. එමනිසා, එය පසුගිය වසර සමග සැසදීමේදී 40% ක අඩුවීමකි. විකුණුම් පහත වැටීම සහ ස්ථාවර පොදුකාර්ය පිරිවැය නිසා එවැනි අඩුවීමක් සිදුවිය.





### 02. ශුද්ධ වත්කම


පසුගිය වසර අගය වූ රු.මිලියන 771.65 සමග සසඳන විට වසර අවසාන ශුද්ධ වත්කම් තත්ත්වය රුපියල් මිලියන 787.76 ක් දක්වා ඉහළ ගොස් තිබේ.




## 03. <u>ආදායම</u>

2019/2020 මූල්‍ය වර්ෂය අවසන් වූ විට රු. මිලියන 510 ක දළ පිරිවැටුමක් අත්කර ගත් අතර, එය පසුගිය වසරට වඩා සාපේක්ෂව සුළු අඩුවීමකි. මෙට්‍රික් ටොන් 44,428.64 ක විකුණුම් මට්ටමක් වාර්තා කිරීමට සංවිධානයට හැකි වූ අතර, එය පසුගිය වසර වන විට මෙට්‍රික් ටොන් 48,886.22 ක හා සසඳන විට 9% ක අඩුවීමකි.






## <u>ප්‍රාග්ධන වියදම්</u>

පසුගිය වසර පහ සඳහා ප්‍රාග්ධන වියදම් පහත පරිදි වේ.

## <u>අත්පත් කරගැනීම් සහ නොනිම් ප්‍රාග්ධන වැඩ</u>

| වසර | වටිනාකම (රු.) |
|---|---|
| 2015/16 | 53,251,881.57 |
| 2016/17 | 9,274,995.81 |
| 2017/18 | 2,718,545.20 |
| 2018/19 | 7,146,545.44 |
| 2019/20 | 4,380,430.88 |

වසර තුළ අත්දකින්නාවූ අස්ථාවරත්වය නිසා ඇතිවන අහිතකර මුදල් ප්‍රවාහය හේතුවෙන් ආයතනය විසින් ප්‍රාග්ධන වත්කම් හෝ වෙනත් සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ආයෝජනය සීමා කර ඇත.

## 04. <u>පොදු බෙදීම් හා රාජ්‍ය ආයතන සඳහා ගෙවීම්</u>

සමාගමේ එකම කොටස්කරුවා මහා භාණ්ඩාගාරයවේ. පවත්නා 2019/2020 වර්ෂය සඳහා අතුරු ලාභාංශ ගෙවා නැත. සමාගම පවත්නා ලාභදායීත්වය සහ මුදල් ප්‍රවාහයන් සළකා බැලීමෙන් අනතුරුව එළැඹෙන වාර්ෂික මහා සභා රැස්වීමේදී වර්ෂය සඳහා අවසාන ලාභාංශ යෝජනා කර අනුමත කරනු ලැබේ.

*ප්‍රධාන කළමනාකරු*

## රැස්වීම් පිළිබඳ දැනුම්දීම

සී/ස ලංකා පොස්පේට් සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2020 සැප්තැම්බර් මස 30 වන දින පස්වරු 4.00 ට කොළඹ 14, නව කැළණිපාලම පාර, අංක 73 1/1 දරණ ස්ථානයේ පිහිටි ප්‍රධාන කාර්යාලයේදී පහත කාරණා සඳහා පවත්වන බව කොටස්කරුවන්ට මෙයින් දැනුම් දෙමි.

1. සමාගමේ සංගමයේ ලිපිවල 53 වන වගන්තිය ප්‍රකාරව “කෙටි දැන්වීමේ" වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්වීමට භාණ්ඩාගාර ලේකම්ගේ (සමාගමේ සියලුම කොටස්වල ලියාපදිංචි හිමිකරු ලෙස) ලිඛිත අවසරය ලබාගැනීම.
2. 2019 සැප්තැම්බර් මස 20 දිනැති වාර්ෂික මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තා අනුමත කිරීම
3. 2020.03.31 න් අවසන් වූ වසර සඳහා ගිණුම් විගණන ගිණුම් ප්‍රකාශය හා 2020.03.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය හා විගණකාධිවරුන්ගේ වාර්තාව මෙහි සඳහන් කර ඇත.
4. මේ සමඟ එවනු ලබන වාර්ෂික වාර්තාව ලැබීමට සහ අනුමත කිරීම.
5. මහා භාණ්ඩාගාරයට සමාගමේ එකම කොටස්කරු ලෙස 2019/2020 වර්ෂය සඳහා ලාභාංශ බෙදා හැරීම අනුමත කිරීම
6. සමාගමේ සංගමයේ ලිපිවල 92 සහ 93 වන වගන්ති ප්‍රකාරව විශ්‍රාම යන (වාර්ෂික මහා සභා රැස්වීමේදී) විශ්‍රාම යන අධ්‍යක්ෂකවරුන් වන ඩී.ආර්.ටී.රුවන්පුර මහතා සහ ජේ.ඒ.ඩබ්.ජයසූරිය මහතා සමාගමේ සංගමයේ 94 වන වගන්තිය යටතේ නැවත තේරී පත්වීම.
7. 2020/2021 වර්ෂය සඳහා විගණකවරු පත්කිරීමට සහ අවුරුද්ද සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පාරිතෝෂිකය තීරණය කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් හට බලය පැවරීම.
8. දැනුම් දී ඇත අනෙකුත් දේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය මත,

**සී/ස ෆයිනෑන්ෂල් සර්විස් සහ කොමර්ෂල් ඒජන්සීස් (පුද්ගලික) සමාගම**

**සී/ස ලංකා පොස්පේට් සමාගමේ ලේකම්වරුන්**

**සටහන්**

මහා සභා රැස්වීමේදී කොටස්කරුවෙකුට ඔහු වෙනුවෙන් ඡන්දය දීමට, ඔහු/ඇය වෙනුවෙන් ඡන්දය පාවිච්චි කිරීමට සහ පැමිණීමට ප්‍රතියුක්තකයෙකු පත් කිරීමට හිමිකම් තිබේ. ප්‍රතියුක්තකයා සමාගමේ සාමාජිකයෙකු වීම අවශ්‍ය නැත. මෙම අරමුණ සඳහා ආකෘති පත්‍රය අමුණා ඇත

## පෙරකලාසියේ ආකෘතිය

### *සී/ස ලංකා පොස්පේට් සමාගම*

### *බ ල ප ත්‍ර ය*

...................................................................................................පදිංචි..............................................................වන, මම/අපි ඉහත සඳහන් සමාගමේ සාමාජිකයෙකු වීම හේතුවෙන් ............................................ පදිංචි ...................................හෝ ඔහු/ඇය අසමත් වුවහොත් .......................................... පදිංචි ......................................................... යන අය මගේ/අපගේ බලය ලත් නියෝජිතයා වශයෙන් 2020 සැප්තැම්බර් මස 30 වන දින සමාගමේ පැවැත්වෙන වාර්ෂික මහා සභා රැස්වීමේදී සහ යම් කල් තැබීමකදීද එයට ප්‍රතිඵලයක් වශයෙන් පැවැත්වෙන සෑම ඡන්ද රැස්වීමකදීම, අප/මා වෙනුවෙන් ඡන්දය දීමට මෙයින් පත් කරමි/කරමු.

2020 ..........................මස........................දිනයේදී අත්සන් කරන ලදී.

අත්සන ……………………………..

<u>සටහන</u>

- නියෝජිතයාට ඔහුට සුදුසු යයි සිතෙන පරිදි රැස්වීමකදී ඉදිරියට ගෙනෙන ලද ඕනෑම යෝජනාවකට ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිය
- නියෝජිතයා සමාගමේ සාමාජිකයෙකුවීම අවශ්‍ය නැත.
- සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් මෙහි පිටුපස සටහන් කොට ඇත.